2022 අගෝස්තු 04
2022 ஆகஸ்ட் 04
04 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොලොස් වන කාණ්ඩය - 06 (i)
பதினோராவது தொகுதி - 06 (i)
Eleventh Volume - 06 (i)

## මහා නගර සභා
## மாநகர சபைகள்
## Municipal Councils

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# 2018, 2019 හා  2020 වර්ෂ සඳහා

## ත්‍රෛවාර්ෂික වාර්තාව

# මහා නගර සභා


## පටුන


| | හැඳින්වීම | පිටු අංකය |
|---|---|---|
| 01. | මහනුවර මහා නගර සභාව | 06 |
| 02. | නුවරඑළිය මහා නගර සභාව | 09 |
| 03. | මාතලේ මහා නගර සභාව | 12 |
| 04. | දඹුල්ල මහා නගර සභාව | 16 |
| 05. | මාතර මහා නගර සභාව | 16 |
| 06. | ගාල්ල මහා නගර සභාව | 17 |
| 07. | හම්බන්තොට මහා නගර සභාව | 17 |
| 08. | බණ්ඩාරවෙල මහා නගර සභාව | 19 |
| 09. | බදුල්ල මහා නගර සභාව | 19 |
| 10. | අනුරාධපුර මහා නගර සභාව | 20 |
| 11. | පොළොන්නරුව මහා නගර සභාව | 24 |
| 12. | රත්නපුර මහා නගර සභාව | 25 |
| 13. | කොළඹ මහා නගර සභාව | 28 |
| 14. | මොරටුව මහා නගර සභාව | 31 |
| 15. | මීගමුව මහා නගර සභාව | 31 |
| 16. | ගම්පහ මහා නගර සභාව | 34 |
| 17. | දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව | 36 |
| 18. | කඩුවෙල මහා නගර සභාව | 38 |
| 19. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව | 39 |
| 20. | කුරුණෑගල මහා නගර සභාව | 42 |
| 21. | කල්මුණේ මහා නගර සභාව | 53 |
| 22. | අක්කරෙයිපත්තු මහා නගර සභාව | 55 |
| 23. | යාපනය මහා නගර සභාව | 56 |
| 24. | මඩකලපුව මහා නගර සභාව | 57 |

පළාත් පාලන ව්‍යුහය තුළ ඉහළම පළාත් පාලන ආයතනය වනුයේ මහා නගර සභා පළාත් පාලන ආයතනය වේ. මෙම පළාත් පාලන ආයතනය ව්‍යුහය පාලනය වන ප්‍රධාන මූලික නීතිය වනුයේ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත (252 අධිකාරිය) වේ.

මහා නගර සභාවලට අයත් මූලික කර්තව්‍ය වනුයේ මහජන සෞඛ්‍ය, මහජන උපයුක්තතා සේවා, පොදු මංමාවත් පිළිබඳ සියලු කාරණා විධිමත් කිරීමද, පාලනය කිරීමද, පරිපාලනය කිරීමද, සාමාන්‍යයෙන් මහජනයාගේ සැප පහසුකම්, පහසුකම් සුභ සාධන කටයුතු හා මහ නගරයේ සුඛ විහරණ ක්‍රම ආරක්ෂා කිරීමද, ප්‍රවර්ධනය කිරීමද වේ. මෙම මහා නගර සභාවල ප්‍රධාන සංයුතිය වනුයේ නගර සභාපතිවරයාගෙන්, නියෝජ්‍ය නගරාධිපතිවරයෙක්ද, ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් සංඛ්‍යාවකින් යුක්ත වන අනෙකුත් සභික සංඛ්‍යාවකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන පළාත් සංඛ්‍යාව ආවරණය වන පරිදි මහා නගර සභා විසිහතරකින් සමන්විත වේ. බස්නාහිර පළාත සඳහා මහා නගර සභා 7 ක්ද, මධ්‍යම පළාත් සඳහා මහා නගර සභා 4 ක්ද, නැගෙනහිර හා දකුණු පළාත් සඳහා මහා නගර සභා 3 බැගින්ද, ඌව පළාත හා උතුරු මැද පළාත සඳහා මහා නගර සභා 2 බැගින්ද, වයඹ, උතුරු, සබරගමුව පළාත් සඳහා මහා නගර සභා 1 බැවින්ද පිහිටුවා ඇත. පහත රූපසටහන ප්‍රකාරව පළාත් අනුව මෙම මහා නගර සභාවල ව්‍යාප්තිය දැක්වේ.




**(ඡායරූපය 1)**

2018, 2019 හා 2020 වර්ෂ තුන සඳහා මහා නගර සභා 24 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ ආදායම රුපියල් මිලියන 80,392 ක් වූ අතර, මෙම වර්ෂ තුන සඳහා මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ වියදම රුපියල් මිලියන 80,443 ක් විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට මෙම මහා නගර සභා 24 හි ආදායම වර්ධනය 2.6 % ක් වූ අතර, වියදමේ වර්ධනය 0.8 % ක් විය. 2018 වර්ෂයේ මහා නගර සභා 7 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම ඌනතාවල සමස්ථ එකතුව රු. මිලියන 1,020 ක් විය. 2019 වර්ෂය වනවිට මෙම මහා නගර සභා අතුරින් මහා නගර සභා 12 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම මහා නගර සභාවල සමස්ථ ඌනතාවය රු. මිලියන 2,186 ක් විය. කෙසේ වුවද, 2020 වර්ෂය වනවිට මෙම මහා නගර සභා අතුරින් මහා නගර සභා 2 ක මූල්‍ය ප්‍රකාශන අනුව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම සමස්ථ ඌනතාවය රු. මිලියන 431 ක් විය. මෙම ඌනතාවය විග්‍රහ කිරීමේදී කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 2018, 2019 හා 2020 වර්ෂයන්හි පිළිවෙලින් කොළඹ මහා නගර සභාවේ රු. මිලියන 883 ක , 1,195 ක හා 367 ක ඌනතාවයක් පෙන්නුම් කිරීමයි. මෙම මහා නගර සභා අතුරින් මහා නගර සභා 9 ක 2018, 2019 හා 2020 වර්ෂ 3 සඳහාම අතිරික්තයක් පෙන්වා තිබුණි.

මහා නගර සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව මහා නගර සභා 24 තුළ මුලු වත්කම් ප්‍රමාණය 2018 වර්ෂයේ රු. මිලියන 52,231 ක්ද, 2019 වර්ෂයේ රු. මිලියන 55,435 ක්ද, 2020 වර්ෂයේ රු . මිලියන 104,430 ක් ද වශයෙන් නියෝජනය විය. මේ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට මෙම මහා නගර සභාවල මුලු වත්කම්වල වර්ධනය 100% ක් විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මුලු වත්කම් රු. මිලියන 41,026 කින් වැඩි වී තිබුණි. ඊට හේතුව වන්නේ 2020 වර්ෂයේ සිට බස්නාහිර හා උතුරුමැද පළාත තුළ වූ පළාත් පාලන ආයතනවල පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ගිණුම් පිළියෙල කිරීම නිසා වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තැබීම හා ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීමය.

මහා නගර සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව මහා නගර සභා 24 න් මුලු වගකීම් ප්‍රමාණය 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 15,052 ක්ද, රු. මිලියන 19,196 ක්ද, සහ රු. මිලියන 21,005 ක්ද විය. කුරුණෑගල මහා නගර සභාවේ මුලු වගකීම් ප්‍රමාණය 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට 336% කින් වර්ධනය වී තිබුණි. මීට හේතුව ණය ප්‍රාග්ධනය 2018 ට සාපේක්ෂව 2020 දී රු.මිලියන 695 කින් වැඩිවීමය.

2020 දෙසැම්බර් 31 දිනට මහා නගර සභා 24 හි ශුද්ධ වත්කම් ප්‍රමාණය රු. මිලියන 92,030 ක් විය. මේ අතුරින් ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව රු. මිලියන 41,736 ක වැඩිම ශුද්ධ වත්කම් ප්‍රමාණය

නියෝජනය වන අතර, අඩුම ශුද්ධ වත්කම් ප්‍රමාණය නියෝජනය වූයේ හම්බන්තොට මහා නගර සභා වන අතර, එම ප්‍රමාණය රු. මිලියන 139 ක් විය.

මහා නගර සභා ආඥා පනතේ (262 අධිකාරිය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර සියලුම මහා නගර සභා විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. එම 2018, 2019 හා 2020 වර්ෂයන්ට අදාලව, මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන පනතේ 11(1) හා 11(2) ප්‍රකාර මතය ඇතුළත් සම්පිණ්ඩන හා කළමනාකරණ වාර්තාවන් සියලුම සභාවන් වෙත ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයේ මහා නගර සභා 22 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයද, අනුරාධපුර මහා නගර සභාව සඳහා මතය ව්‍යාවනය හා කඩුවෙල මහා නගර සභාව සඳහා අහිතර මතයද ප්‍රකාශ කර තිබුණි. 2019 වර්ෂයේ මහා නගර සභා 20 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයද, මීගමුව, අනුරාධපුර, පොළොන්නරුව හා මඩකලපුව මහා නගර සභා සඳහා අහිතකර මතයද ප්‍රකාශ කර තිබුණි. 2020 වර්ෂයේ මහා නගර සභා 23 සඳහා තත්ත්වාගණනය කළ මතයද මාතලේ මහා නගර සභාව සඳහා අහිතකර මතයද  ප්‍රකාශ කර තිබුණි. සමස්ථයක් ලෙස ගත් කල 2018 වර්ෂයේ මහා නගර සභා සඳහා 92% ක් තත්ත්වාගණනය කල මතයද, 2019 වර්ෂයේ මහා නගර සභා සඳහා 83% ක් තත්ත්වාගණනය කල මතයද, 2020 වර්ෂයේ මහා නගර සභා සඳහා 96% ක් තත්ත්වාගණනය කළ මතයද ප්‍රකාශ කර තිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් සෑම මුදල් වර්ෂ තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව මාස නවයක් ඇතුළත සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයකම තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතුය. මෙම වාර්තාවේ ඇතුළත් විය යුතු කරුණු අතර හඳුනා ගත් ප්‍රධාන ඌනතා, ඒ සඳහා විගණකාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සහ විගණනය කරනු ලබන අස්ථිත්ව විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග තිබිය යුතු අතර, පාර්ලිමේන්තුවට ඒ වාර්තාව භාරදෙන අවස්ථා වනවිට ඒ පිළිබඳ පැවති තත්ත්වය ගැනද සඳහන් විය යුතුය. ඉහත පනත ප්‍රකාරව මෙතෙක් නොවිසඳී ඇති මහා නගර සභා 24 ක විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

| **01.** | **මහනුවර මහා නගර සභාව** | | | |
|---|---|---|---|---|
| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
| | ------------------------ | ------------------- | ---------------------------- | ---------------------- |
| (අ) | අනවසර ඉදිකිරීම් වෙනුවෙන් අය කළ රු.80,583,133 ක් ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘති ඉටු කිරීමට භාවිතා නොකර, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අදාළ ව්‍යාපෘති සඳහා අරමුදල් භාවිතා කළ යුතු වේ. | බෝගම්බර පොරොත්තු බස් නැවතුම් පොළ අසළ පවතින කඩ කාමර ඉවත් කර, නිසි ප්‍රමිතියට අනුව, සකස් කිරීමට අරමුදල් යොදා ගනිමි. | අරමුදල් තවදුරටත් වැය කර නොමැත. |
| (ආ) | කටුගස්තොට මහජන පොදු වැසිකිළියේ බදුකාරිනියගෙන් 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් අය විය යුතු රු.1,013,466 ක ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගත යුතු වේ. | සභාවේ අනුමැතියට යොමු කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | අය කිරීම් හෝ වෙනත් ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. |
| (ඇ) | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් අධ්‍යාපන සහතික වංචනික ලෙස වෙනස් කර ඉදිරිපත් කිරීම සනාථ වී තිබිය දී, ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර, යථෝක්ත නිලධාරිනිය පවුල් සෞඛ්‍ය සේවයේ II පන්තියට උසස් කර, 2008 ජනවාරි 01 දින සිට 2017 ජූලි 31 දින දක්වා රු.3,130,652 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ, පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ෂණයක් සිදු කිරීමට නාගරික කොමසාරිස් වෙත යොමු කර තිබූ නමුත්, මේ දක්වා මූලික විමර්ෂණය සිදු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ෂණයන් පැවැත්වීමට නිලධාරියෙකු පත් කර ඇතත්, මහා නගර සභාව ඉදිරි කටයුතු කර නොමැත. | විමර්ෂණ අවසන් කර ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (ඈ) | සභාවේ වරිපනම්, මිශ්‍ර ආදායම්, ජල, ගබඩා, ගිණුම් පිළියෙල කිරීමට අදාළ පරිගණක මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා වූ මිල ගණන් ඇගයීමේ තාක්ෂණික ඇගයීම් වාර්තාවට අත්සන් යෙදීමේ දී, බාහිර කමිටු සාමාජිකයෙකු වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ, | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | ව්‍යාජ අත්සන් යොදා ඇති බව පිළිගන්නා බව හා මූලික විමර්ෂණ හා රස පරීක්ෂක වාර්තා තවදුරටත් පරීක්ෂා කරමින් පවතී. | අඩුපාඩුව සම්බන්ධයෙන් අදාළ කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පීයාධීපතිගේ අත්සන ව්‍යාජ ලෙස යොදා රු.8,659,200 වටිනාකමැති පරිගණක මෘදුකාංග සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. | | | |
| (ඉ) | මහනුවර සිට කටුගස්තොට දක්වා ප්‍රධාන නගරයට යාබඳව ජල නළ එළීමේ කර්මාන්තය රු.210,528,076 ක වටිනාකමකට 2016 වර්ෂයේ දී, කොන්ත්‍රාත් ආයතනයකට පවරා තිබූ අතර, ඊට අදාළ විගණන පරීක්ෂාවේ දී,<br>අදාළ කොන්ත්‍රාත් සමාගම වෙත ලබා දිය යුතු බවට ජල කර්මාන්ත ඉංජිනේරු යෝජනා කිරීම හා අවසානයේ රු.210,528,076 ක මුදලකට අදාළ කොන්ත්‍රාත් සමාගමට ව්‍යාපෘතිය ලබා දී තිබූ බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1(අ) ii ට පටහැනිව කොන්ත්‍රාත්තුවට අදාළ පිරිවිතර පිළියෙල කළ හා නිර්දේශ කළ ප්‍රධාන නාගරික ඉංජිනේරුවරයා හා ජල කර්මාන්ත ඉංජිනේරුවරයා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා හා සාමාජික ලෙස කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන නැත. නාගරික නිලධාරීන් වෙනුවෙන් පවරා ඇති බලතල අනුව, නිවැරදිව කටයුතු කරන බව දන්වා ඇත. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. ප්‍රධාන ඉංජිනේරු විශ්‍රාම ගොස් ඇති අතර, දැනට විශ්‍රාම වැටුප අත්හිටුවා ඇත. |
| (ඊ) | කැප්පෙටිපොල වෙළඳ සංකීර්ණයේ පහත මහලේ කඩ කාමර දීර්ඝ කාලයක සිට වසා දමා තිබූ අතර, කඩ කාමර 34 කින් රු.1,221,291 ක කඩ කුලිය වසර 02 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ මුදල් අය කිරීමට හා කඩ කාමර කුලියට දීම කළ යුතුවේ. | වෙළඳ සංකීර්ණය අලුත්වැඩියා කර බදුකරුවන් සඳහා ලබා දෙන බව දන්වා ඇත. | කඩ කාමර 16 ක බිල් කිරීම් නවතා ඇත. හිඟ අය කර නැත. |
| (උ) | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගුඩ්ෂෙඩ් වෙළඳ සංකීර්ණයේ කඩහිමියන් වෙත වන්දි හිමිකම් ප්‍රදානය කිරීමේ දී, සභාවට ලැබියයුතු රු.4,235,468 ක කුලී අය | වන්දි ගෙවීම් නිවැරදි ක්‍රමවේදය අනුව, සිදු කළ යුතුවේ. | සාකච්ඡා කර තීරණයක් ගැනීමට නියමිතය. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොකර, වන්දි හිමිකම් ගෙවා අවසන් කර තිබුණි. | | | |
| (ඌ) | සභාව විසින් ජල සැපයුම් කර තිබූ පාරිභෝගිකයෙකු 2015 වර්ෂයේ දී, ජල මනුවට සිදු කළ අලාභ හානි වෙනුවෙන් මනු අලාභය ලෙස රු.58,880 ක් පමණක් අය කර තිබූ නමුත්, මනු හානිය නිසා, අඩුවෙන් පෙන්වන ලද ජල පරිභෝජනය වෙනුවෙන් අය විය යුතු රු.2,495,723 ක මුදලක් අය කර නොතිබුණි. | අලාභ අයකළ යුතුවේ. | මනු හානිය නිසා, අඩුවෙන් පෙන්වන ලද ජල පරිභෝජනය ගණනය කිරීම | අඩුපාඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (එ) | අනුකූලතා සහතික ලබා නොගෙන පදිංචි වීම මත ව්‍යාපාරික ඒකක 10 කින් 2018 වර්ෂයේ සිට අය කළ යුතු රු.1,878,500 ක දඩ මුදල් අය කර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ වගන්ති ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම | උපදෙස් ඉල්ලා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යොමු කිරීම | අය කර නැත. |
| (ඒ) | බලපත්‍ර ලබා ගැනීමකින් තොරව නිත්තවෙල ක්‍රීඩාංගණය තුළ රු.2,567,440 ක ගාස්තු අයවිය යුතු දැන්වීම් පුවරු 43 ක් ප්‍රදර්ශනය කර තිබුණි. | අතුරු ව්‍යවස්ථා මාලාව අනුව ක්‍රියා කළ යුතු වීම | නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සොයා බලා නීත්‍යානුකූලව නඩු පැවරීමට කටයුතු කරන බව | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |
| (ඔ) | 2019 වර්ෂයේ සිට වෙළඳ පොළවල් බදු දීම මඟින් හා කඩ කාමර සඳහා ටෙන්ඩර් ගාස්තු ලෙස අය විය යුතු රු.70,029,564 ක් ද මැණික්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ලැබිය යුතු රු.21,768,049 ක් ද අය කර නොතිබුණි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම | මේ සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන බව | අයකර නොමැත. |
| (ඕ) | පේරාදෙණිය තානායම බදු දීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් මහා නගර සභාවට අය විය යුතු එකතුව රු.8,132,601 ක කුලී මුදල් අය කර නොතිබුණි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම | ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් වෙතින් නිකුත් කර ඇති ලිපිය අනුව, ගාස්තු සියයට 70 සිට සියයට 65 දක්වා අඩු කිරීම | අය කර නැත. |
| (ක) | අය නොවී වසර 05 කට අධික කාලයක් ඉක්මවා තිබූ දැන්වීම් පුවරු ගාස්තු හා අනතුරට පත් වාහනවලට අදාළව ලැබිය යුතු රු.13,306,602 ක් අය කිරීමට හා අවුරුදු 01 සිට 05 අතර කාල පරාසයක් ගත වී ඇති රු.109,495,156 ක කුලී, ඉඩම් බදු හා රථ වාහන ගාස්තු | ලැබිය යුතු ශේෂ අය කළ යුතු වීම | මේ සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන බව | අය කිරීමට පියවර ගැනීමට හෝ නීති කටයුතු සිදු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අය කිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | | | |
| (ග) | විධිමත් ටෙන්ඩර් පරිපාටියකින් හා නීත්‍යානුකූල ගිවිසුම්ගතවීමකින් තොරව 2007 වර්ෂයේ සිට බාහිර පාර්ශවයක් විසින් භුක්ති විඳින දළදා වීදියේ අංක 74 ස්ථානයේ පිහිටි නාගරික ඉඩමේ නොදියුණු තක්සේරු වටිනාකම රු.55,000,000 ක් ලෙස 2015 අගෝස්තු මස තක්සේරු කර ඇතත්, කිසිදු මුදලක් අය කිරීමට හෝ සන්තකය පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හෝ සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව, දේපළ බදු දිය යුතු වීම | අදාළ මුදල් අය කිරීමට හා සන්තකය පවරා ගැනීම සඳහා තීරණයක් ගෙන ඇත. | මුදල් අය කිරීමට හෝ සන්තකය පවරා ගැනීම සිදු කර නැත. |
| **02.** | **නුවරඑළිය මහා නගර සභාව** | | | |
| (අ) | ග්‍රෙගරි වැවේ බෝට්ටු සේවය ආරම්භයේ සිට 2021 අප්‍රේල් 30 වන දින දක්වා කාලය තුළ බෝට්ටු හිමියන් 40 දෙනෙකුගෙන්, රු.15,987,248 ක මුදලක් අයවීමට තිබුණි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. | හිඟ මුදල් ගෙවා නිම කරන තෙක් බෝට්ටු ධාවනය නවතා ඇත. | 2021.07.31 දිනට පැවති හිග මුදල රු. 18,046,915.00 කි. අදාළ හිග මුදලින් පළමුව 25% ක් ගෙවීමෙන් පසුව පමණක් බෝට්ටු ධාවනයට අවසර ලබා දෙන බවට ලිඛිතව දැනුවත් කරන ලද අතර, ඉතිරි මුදල 2022.03.31 දිනට පෙර ගෙවිය යුතු බවට සඳහන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රධාන තක්සේරුකරුගේ 2003 පෙබරවාරි 27 දිනැති තක්සේරුව හා මධ්‍යම පළාත් තක්සේරුකරුගේ 2019 අගෝස්තු 21 දිනැති කඩකුලී තක්සේරුව සම්බන්ධයෙන් කඩකුලී හිමියන්ගේ හා නාගරික මන්ත්‍රීවරුන්ගේ විරෝධතා හේතුවෙන් නව තක්සේරු කුලිය අය නොකිරීම නිසා 2003 වර්ෂයේ සිට මහා නගර සභාවට මේ දක්වා අහිමි වී ඇති සමස්ත ආදායම රු.254,786,700 ක් විය. | සභා අරමුදලට පාඩුවක් නොවන සේ තීරණ ගත යුතු වේ. | මතුවූ විරෝධතා හේතුවෙන් මෙසේ සිදු වී ඇත. | 2009 වර්ෂයේදී සිදු කළ තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සභාව වෙත යොමු කරන ලදුව එහිදී තීරණය වූයේ එවකට ක්‍රියාත්මක කරන ලද තක්සේරුවෙන් 25 % ක් වැඩි කර අය කිරීමටයි. ඒ අනුව මේ දක්වා කඩකුලී අය කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | මහා නගර සභාව සහ කඩ හිමියන් අතර අත්සන් කරන ලද ගිවිසුමේ II (2) එකඟතාවය අනුව කඩ කාමර අතුරු බදුදිය නොහැකි වුවද, කඩ කාමර 90 ක් අතුරු බදු දී තිබූ බව තහවුරු වී | අතුරු බදුකරු වෙත අයිතිය පවරා දීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරමි. | 2016/03 චක්‍රලේඛය අනුව කඩ කාමර වල නම් මාරු කිරීමට අවශ්‍ය අනුමැතිය සභාව වෙත යොමු කර ඒ සඳහා මේ වන විට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අගෝස්තු 15 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛය අනුව කඩ අතුරු බදු දී ඇති අවස්ථාවක මාස 120 ක කුලිය ලබා ගනිමින් අතුරු බදුකරු වෙත අයිතිය පවරා දීමට අවසර ලබාදී තිබුණද අතුරු බදු දී තිබූ කිසිදු කඩයක අයිතිය මාරු කිරීමට 2021 අප්‍රේල් 28 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | | | දන්වා ඇත. |
| (ඈ) | අක්කරයක පමණ වපසරියකින් යුතු බඹරකැළේ ගල් වල ඉඩම හා 2008 දෙසැම්බර් 24 දින වර්ෂයකට රු.26,500ක මුදලකට ව්‍යාපාරිකයෙක් වෙත බදු දී තිබුණි. බදු ගිවිසුමේ දෙවන උප වගන්තිය අනුව ගිවිසුම් කාලය 2012 දෙසැම්බර් 24 දිනෙන් අවසන් වුවද ඉඩම සහ ගල්වල 2020 අවසන් වනවිටද පවරා | සභා අරමුදලට පාඩුවක් නොවන සේ තීරණ ගත යුතු වේ. | ලිපි ගොනු අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිසම වෙත රැගෙන ගොස් පරීක්ෂණයක් පැවැත්වේ. | බඹරකැලේ ගල්වල නැවත නගර සභාව වෙත පවරා ගැනීමට ප්‍රථම මායිම් නිරවුල් කර ගැනීමට අවශ්‍යවූ හෙයින් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මැනුම් කටයුතු සිදු කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| **03.** මාතලේ මහා නගර සභාව | | | | |
| **(අ)** | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ වාර්තාවන්ට අනුව සභාවට අයත් රු.2,600,000 ක් වටිනා ඉඩම් 2 ක බාහිර පුද්ගලයින් අනවසරයෙන් ගොඩනැගිලි සාදා පදිංචි වී ඇතිමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග දක්වා නොමැත. | ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොමැත. |
| **(ආ)** | නාගොල්ලේ පිහිටි රූඩ් 01 පර්චස් 25.7 ක බිම් කොටස ගිවිසුම් මත පුද්ගලයින් 12 දෙනෙකුට 1988 වර්ෂයේදී දීර්ඝ කාලීනව බදු දී තිබූ අතර, බදුකරුවන් විසින් එහි අනවසරයෙන් ඉදිකිරීම් සිදුකර තිබුණි. මෙම කඩ කාමර සඳහා රු.31,280,000 ක බදු කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල ව කටයුතු කර අදාළ ගැටළු නිරාකරණය කරගත යුතු වීම. | කඩහිමියන් 12 දෙනා අතර නීත්‍යානුකූලව බදුදීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපි යොමු කිරීමෙන් පසු එහිදී ලබාදෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව නිරාකරණය කරගැනීමට නාගරික නීතිඥ වෙත යොමුකර ඇත. එහිදී අදාළ වාර්තාව | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගෙන හිඟ බදු කුලී අය කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලැබීමෙන් පසු මහා නගරසභා ආඥා පනතේ 40(i)ඊ ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. | |
| (ඇ) | පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු තම ව්‍යාපෘති අංගනය පවත්වාගෙන යාම සඳහා 2018 වර්ෂයේදී මහා නගර සභාවට අයත් අක්කරයක විශාලත්වයකින් යුතු පාරාවත්ත ඉඩම පරිහරණය කර, සිදුකළ ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ අවශ්‍ය නීතිමය පියවර ගැනීම. | මෙම ඉඩම සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කරන බව. | නීතිමය පියවර ගෙන නොමැත. |
| (ඈ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 179(අ)(ආ) වගන්තිවලට පටහැනිව කටයුතු කර මාතලේ නගරයේ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 60 දරන කඩ කාමරයේ බදුකරු ලෙස 2012 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගත වී තිබූ අයෙක් 2018 මාර්තු 09 දිනැති අංක 2061/42- 05 අංක | පනතේ විධිවිධානවලට අනුවකටයුතු කිරීම හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | වක්‍රලේඛ ප්‍රකාරව නිත්‍යානුකූලව කටයුතු කිරිමට උපදෙස් ලබාදී ඇති බව. | අදාළ සභිකවරයා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන හෝ අදාළ මුදල් අයකර හෝ නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මාතලේ මහා නගර සභාවේ සභිකයෙකු ලෙස පත්කර තිබුණි. එසේම එම කඩ කාමරය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු.1,296,456 ක එක්වන් මුදලක් හා රු.3,488,945 ක දඩ මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | වරිපනම් ඒකකයක මුළු හිඟ මුදල රු.15,000 ක් ඉක්මවූ පෞද්ගලික දේපලවලින් රු. 6,695,597 ක හිඟ වරිපනම් බදු හා රාජ්‍ය ආයතන වලින් රු.3,837,103 ක හිඟ වරිපනම් බදු ශේෂයක්, 2021 වර්ෂයේ නොවැම්බර් 12 දිනට අය කර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම හා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනමින් අවශ්‍යක්‍රියාමාර්ග ගැනීමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව. | තව දුරටත් අයවිය යුතුව තිබුණි. |
| (ඊ) | 2009 වර්ෂයේ ගිවිසුම්වලට එළඹ තිබූ කඩ කාමර 14 කින් එකතුව රු.3,389,297ක එක්වන් මුදලක් හා ඊට අදාළව | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු | ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට උපදෙස්ලබාදී ඇති බව. | මුදල් කිසිවක් අයවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගණනය කර තිබුණු එකතුව රු.22,880,827 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කිරීම. | | |
| (උ) | අඹගහමුල බස්නැවතුම්පලෙහි බිම් මහලෙහි හා පළමු මහලෙහි පිහිටි කඩ කාමර 29 න් කඩ කාමර 22 ක් වසර 18 ක කාලයක සිට වසා දමා නිෂ්ක්‍රීයව විනාශ වීමට ඉඩහැර තිබියදී අවශ්‍යතාවය නිශ්චිතව හඳුනානොගෙන හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව රු.10,794,600 ක් වැයකර දෙවැනි මහල ඉදිකර තිබුණි. පළමු මහලේ බිත්ති හා තලාද (Beam) පුපුරා ඉරිතලා ගොස් ගොඩනැඟිල්ල අස්ථාවර මට්ටමක තිබියදී ඒ මත දෙවැනි මහල ගොඩනැගිලි සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව ඉදිකර තිබුණි. එමෙන්ම ඉදිකර තිබුණු දෙවන මහල මත වූ ගොඩනැඟිල්ලේ වහලය ද නිසි ප්‍රමිතියකින් ඉදිකර | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිවැරදි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව නිසි පරිදි සැළසුම් කර අවශ්‍යතාවය සළකා බලා අවශ්‍ය ඉදිකිරීම්, එම තාක්ෂණික ශිල්ප ක්‍රමයන්ට අනුව සිදුකළ යුතු බව. | ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කරන බව. | අදාළ නිවැරදි කිරීම් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| **04.** | **දඹුල්ල මහා නගර සභාව** | | | |
| | තිත්තවැල්ගොල්ල ප්‍රදේශයේ රු.1,000,000 ක පමණ වටිනාකමකට සායන මධ්‍යස්ථානයක් හා කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර රු.1,000,000 ක් පමණ වටිනා කායවර්ධන උපකරණද සවිකර තිබුණද 2015 වර්ෂයේ සිට භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් භාවිතයට ගත යුතුය. | ඉදිරියේදි මෙම ස්ථානය ප්‍රයෝජනයට ගතහැකි වන පරිදි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | අඩුපාඩු නිවැරදි කර නොමැත. |
| **05.** | **මාතර මහා නගර සභාව** | | | |
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන චක්‍රලේඛයේ 8.1 වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කර, මුද්දර ගාස්තු ආදායම් එකතු කිරීම වෙනුවෙන් මහා නගර සභාවේ නිලධාරීන් 11 දෙනෙකුට රු.1,365,965 ක කොමිස් මුදල් ගෙවා තිබුණි. | නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ සභාවේ අවධානය යොමු කළ යුතුය. | මෙම විගණන විමසුම ලැබීමෙන් පසුව පිට පළාත්වලින් ලැබිය යුතු මුද්දර ආදායම් රැස් කිරීම සඳහා කිසිඳු නිලධාරියෙකු යෙදවීමට හෝ ඒ වෙනුවෙන් කොමිස් මුදල් ගෙවීමක් හෝ සිදුකර නොමැති බවත් පිට පළාත්වලින් ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය පිළිබඳව කිසිඳු මුදලක් නොලැබී ඇති බවත්, ඒ තුලින් සභාවට සිදුවූ මූල්‍ය පාඩුව තක්සේරු කිරීමක් කළ නොහැකි වී ඇති බව. | අය කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පදික වේදිකා සහ පොදු ස්ථාන අවහිර වන සේ ඉදිකර තිබූ අනවසර වෙළඳසැල් 11ක් සම්බන්ධයෙන් සභාව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර වෙළඳාම ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | නාගරික ඉංජිනේරුගේ උපදෙස් විමසා ඉවත් කිරීමට යෝජිතව ඇති බව. | අනවසර වෙළෙඳාම් ඉවත් කිරීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | සභාව සතු පර්චස් 40.91 කින් යුත් ඉඩම් 03 ක් සභාවේ අනුමැතියකින් තොරව පෞද්ගලික පාර්ශවයක් විසින් පරිහරණය කරමින් පැවතුණි. | නිතිමය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | දකුණු පළාත් මුදල් රීති 561 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා 2020 ජුනි 22 දින අංක 2020/මා/මනස/මුදල් ප්‍ර/06 මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ ස්ථාවර කාරක සභා නිර්දේශය අනුව කමිටුවක් පත් කිරීමට 2020 ජූලි 09 දින අංක 223 ඉ.3 මගින් මහා සභා අනුමත කරන ලද බවත් ඒ අනුව ඉදිරි කටයුතු ආරම්භ කරන බව. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| **06.** | **ගාල්ල මහා නගර සභාව** | | | |
| | 2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කළ යුතුවේ. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය කපා හැරීමට ආණ්ඩුකාරතුමා වෙත ඉල්ලීම් කර ඇත. | මෙම ශේෂය කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් පාලන කොමසාරිස් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| **07.** | **හම්බන්තොට මහා නගර සභාව** | | | |
| (අ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. | සියළුම බදුකරුවන් ලිපි මගින් දැනුවත් කර ඇති අතර බදුකරුවන් | නැවත සියළු බදුකරුවන් 2021 පෙබරවාරි 21 දින |

| | | | | |
|---|---|---|---|---|
| | දරන දකුණු පළාත්, පළාත් පාලන කෙමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 හා 03 ඡේදය ප්‍රකාරව කඩ කාමර කුලිය තක්සේරු කර සභා සම්මත කරගෙන තිබුණද, සභාව සතු කඩ කාමර 50 කට හා ඉඩම් 10 කට අදාලව පැරණි කුලිය අයකිරීම නිසා 2016 වර්ෂයේ ජනවාරි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභා අරමුදලට සිදු වූ පාඩුව රු.11,268,359 ක් විය. | | ගිවිසුම්ගත වීමට එකඟ නොවූ බව. | ලිඛිතව දැනුවත් කළද ප්‍රතිචාරයක් දක්වා නොමැති බව. |
| (ආ) | සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රු.මි. 300 ක වියදමින් 2020 ජුනි 25 දින ක්‍රියාත්මක කළ කවෂිමා ව්‍යාපෘතිය මඟින් කාබනික පොහොර නිපදවීමට දිනකට කසළ ටොන් 30 ත් 50 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වුවත් සභා බල ප්‍රදේශයෙන් දෛනිකව රැස්වන දිරන කසළ ප්‍රමාණය ටොන් 01 ත් 1.5 ත් අතර වූයෙන් දෛනික කසළ අවශ්‍යතාවය රැස්කර ගැනීමට සභාව | ශක්‍යතා අධ්‍යනකින් පසුව ව්‍යාපෘති ආරම්භ කිරීමත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක්ද සකස් කළයුතුය. | හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සංවර්ධන ව්‍යාපෘතිවලට සමගාමීව මෙම ව්‍යාපෘතිය යෝජනා කර තිබූ අතර එම සංවර්ධන ව්‍යාපෘති අතරමග නවතා දැමීම නිසා අපේක්ෂිත කසළ ප්‍රමාණය රැස් කිරීමට අපහසු වූ බවත්, සභාවට ආසන්නව පිහිටි ප්‍රාදේශීය සභා 04 ක් මෙම ව්‍යාපෘතිය සඳහා කසළ ලබාදීමට නොහැකි බවට | හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන සැලැස්ම අතරමග නවතා දැමීමත් සමඟ අපේක්ෂිත කසළ ප්‍රමාණය නොලැබුණු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | අපොහොසත් වී තිබුණු අතර එය රැස්කර ගැනීම සඳහා ක්‍රමවේදයන්ද සකස් කර නොතිබුණි. | | ලිඛිතව දැන් වූ බව. | |
| **08.** | බණ්ඩාරවෙල මහා නගර සභාව | | | |
| | 1987 වර්ෂයේ සිට මහා නගර සභාවට අයත් කෝපියාවත්ත ඉඩම දිගුකාලීන බදු පදනම මත පුද්ගලයින් 24 දෙනෙකුට ලබාදී තිබුණු අතර, ඒ සඳහා අයකර ගත යුතු රු.4,881,060 ක හිඟ බදු මුදල අයකර ගෙන නොතිබුණි. | සියළුම හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේදී මෙම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | බදු මුදල් මාසිකව ගෙවීමට කටයුතු කරන ලෙස දැන්වුවද, මේවනතෙක් කිසිදු මුදලක් ඔවුන් විසින් ගෙවා නොමැත. අදාල කාලය තුල එම බදු මුදල් ගෙවීමට ඔවුන් විසින් ක්‍රියා නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන කරමින් පවතී. |
| **09.** | බදුල්ල මහා නගර සභාව | | | |
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය අනුව කඩ කාමර 252 ක් සඳහා නව තක්සේරු වටිනාකම මත බදු අය කිරීම වෙනුවට 2002 වර්ෂයේ තක්සේරු කරන ලද අගය මත පදනම්ව බදු අය කිරීම නිසා 2019 ජූලි 31 දිනට රු.53,265,050 ක ආදායමක් අහිමි වී තිබුණි. | චක්‍ර ලේඛ උපදෙස් පරිදි නව තක්සේරු වටිනාකම මත බදු අයකළ යුතුය. | නව බදු කුළී අයකිරිම සඳහා එක් එක් ස්ථාන අනුව යම් ප්‍රමාණයක් අයකර ගැනීමට සභා අනුමැතිය ලැබී ඇත. එම අය කිරිම්ද තාවකාලිකව නතර කර ඇති බව හා නැවත සභා තීරණයක් මත අය කිරීමට කටයුතු කරමි. | 2015 තක්සේරුව මත 2021 ජනවාරි සිට කඩකුලී අයකිරීමට බදුකරුවන් දැනුවත් කලද, ඔවුන් බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, ආණ්ඩුකාරතුමාගේ උපදෙස් අනුව නැවත බදු මුදල් සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | බදුල්ල නගරයේ පවත්වාගෙන යනු ලබන සිනමාශාලා දෙකකින් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු.1,756,005 ක හිඟ බදු | හිඟ බදු මුදල් කඩිනමින් අයකරගත යුතුය. | විනෝද බදු මුදල් ගෙවන ලෙස කළමනාකරුට දන්වා ඇති නමුත් ගෙවා නොමැත. නොවිකුණු රිසිට් පොත් සභාව භාරයට ගෙන ඇත. එවැනි | නඩු පවරමින් ඇති අතර, 2015 වර්ෂය සඳහා m 88/21 – m96/21 දක්වා දිසා අධිකරණයේ නඩු පවරා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් අය කරගෙන නොතිබුණි. | | අවස්ථාවක හිඟ මුදල් ගෙවීමට පොරොන්දුවී තාවකාලික ගිවිසුමකටද එළඹ ඇත. එහිදි වාරික දෙකක් පමණක් ගෙවා ඉතිරිය ගෙවා නොමැත. | |
| **10.** | **අනුරාධපුර මහා නගර සභාව** | | | |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 ඡේදය ප්‍රකාරව වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ මිලගණන් කැඳවා මිලදී ගැනීම සිදු කිරීමට අදාළව රැස් වූ ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයන් 40 දෙනෙකුට රු.662,644 ක මුදලක් ගෙවීම් සිදුකර තිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව හිමිකම් නොමැතිව ලබාගත් දීමනා අදාළ නිලධාරීන්ගෙන් අයකරගත යුතුවේ. | අනුරාධපුර මහා නගර සභා ආඥා පනතේ 229 වන වගන්තිය යටතේ ටෙන්ඩර් පිළිබඳ පනවා ඇති කොන්දේසි ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා ඇත. | අයකර ගෙන නැත. |
| (ආ) | උපලේඛනගත රජයේ නිවාසයක පදිංචි වීමේදී විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට දහයක් (10%) අයකරගත යුතු වුවත් හිටපු නාගරික කොමසාරිස් වරයාගෙන් 2009 නොවැම්බර් සිට 2016 ජුනි දක්වා රු.201,017 ක් සහ 2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අයවිය යුතු රු.99,662 ක නිවාස කුලී අයකරගෙන නොතිබුණු අතර | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළයුතු වේ. | 2009 ඔක්තෝබර් 13 දින පැවති මහා සභාවේ තීරණ අංක 44 යෝජනා අංක 05(48) යටතේ නාගරික කොමසාරිස් වරයාට කුලී ගෙවීමකින් තොරව නිළ නිවාසයේ පදිංචි වී සිටීමට අවසර ලබාදීමට තීරණය කර ඇත. | හිටපු නාගරික කොමසාරිස්වරයා 2016 ජුනි මස සිට මහා නගර සභාවෙන් ස්ථානමාරුවී ඇතත් වර්තමාන නාගරික කොමසාරිස් වෙත නිල නිවස භාර නොදී ඔහු එම නිවසේ පදිංචි වී සිටී. හිටපු නාගරික කොමසාරිස්වරයා නිල නිවසේ පදිංචිව සිටි කාලය සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියක් රහිත කාලයට දණ්ඩන කුලී රු.273,949 ක්ද අයකරගෙන නොතිබුණි. එසේම මෙම නිලධාරියා සම්බන්ධව 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | | | නිවාස කුලීද විධිමත් අනුමැතියක් රහිතව සිටි කාලය සඳහා (2018 අප්‍රේල් 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා) දණ්ඩන කුලීද ගෙවා නැත. |
| (ඇ) | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය ප්‍රකාරව නගරාධිපති කාර්යමණ්ඩල පෞද්ගලික ලේකම් හා මහජන සම්බන්ධතා නිලධාරි දෙදෙනාට රු.25,000 ක උපරිමයකට යටත්ව දීමනා ගෙවිය හැකි වුවද 2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා රු.35,000 බැගින් මාසිකව ගෙවීම් කර තිබුණි. තවද එම ගැසට් නිවේදනය ප්‍රකාරව නෛතික ප්‍රතිපාදන නොතිබිය දී පෞද්ගලික ලේකම් වෙත 2019 අප්‍රේල් සිට මාසයකට රු.5,000 බැගින් | ගැසට් නිවේදනය ප්‍රකාරව වැඩිපුර ගෙවීම් අයකළ යුතුවේ. | සභා තීරණ මත ගෙවීම් කර ඇති බව දන්වා ඇත. | මහා නගර සභා බලතල යටතේ මෙම දීමනා ගෙවීම් කර ඇත. ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දුරකථන දීමනා ගෙවා තිබුණි. | | | |
| (ඇ) | පළාත් පාලන ආයතනවල සේවය කරන දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ට සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට වැටුප් හා දීමනා ගෙවීමට මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188 (අ) සිට (ඍ) දක්වා වගන්ති වලින් බලය ලබාදී නොතිබියදී හා විෂයභාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව නිලධාරීන් 32 දෙනෙකුට 2018 වර්ෂය වෙනුවෙන් දිරිදීමනා ලෙස රු.3,496,082 ක් ගෙවා තිබුණි. | දීමනා ගෙවීම් සඳහා විධිමත් අනුමැතීන් ලබාගත යුතුවේ. | සභා අනුමැතිය යටතේ ගෙවීම් කර ඇත. ඉදිරියේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් ලබාගෙන නොමැත. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.96,822,402 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු හිඟය වාර්ෂිකව වැඩිවී ඇති බැවින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදී වරිපනම් බදු එකතු කිරීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.45,698,842 ක් වූ හිඟ කඩ කුලී අයකර ගැනීම | හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා නෛතික | හිඟ කුලී අයකර ගැනීම සඳහා විධිමත් පරිදි ලිපි නිකුත් කර ඇති අතර කඩ | නඩු පැවරීමට කටයුතු කරගෙන යනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කළයුතු වේ. | හිමියන්ගේ ඉල්ලීම් සඳහා මහා සභා තීරණ අනුව ඉදිරි කටයුතු සිදු වෙමින් පවති. | |
| (උ) | කීරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය 2014 සැප්තැම්බර් 18 දින ගිනි ගැනීම සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශන වාර්තාව අනුව රු.මි.3.3 ක අලාභයෙන් හතරෙන් එකක වටිනාකම වන රු.825,000 ක් අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතු බවට එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ විනය නියෝග කඩිනමින් ලබාගෙන වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුවේ. | පාළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ෂණයක් සිදුකර ඇති අතර සහ විනය නියෝග ලැබීමෙන් පසු ඒ අනුව ක්‍රියා කරමි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ශනයක් සිදුකරමින් පවතී. විධිමත් විනය නියෝගයක් නොමැති නිසා අයකර ගැනීමට නොහැකි වී ඇත. |
| (ඌ) | 2012 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ මහා නගර සභාවේ සිදු වී තිබුණු අක්‍රමිකතාවයන් දෙකකින් සහා අරමුදලට සිදුවී තිබුණු රු.47,174,493 ක මූල්‍යමය අලාභය පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු වංචාව සඳහා විධිමත් විනය පරීක්ෂණය අනුව අදාළ අයකරගැනීම සිදුකල යුතු අතර වැටුප් වංචාව සඳහා කඩිනමින් | වරිපනම් බදු අක්‍රමිකතාවය සම්බන්ධයෙන් සිදුකරන ලද විධිමත් විනය පරික්ෂණය අනුව වරදකරුවී ඇති පාර්ශවයන්ගෙන් රු.6,322,302 ක් අයකිරීමට විනය නියෝගය ලබාදී ඇති නමුත් ඒ සඳහා ඔවුන් | වරිපනම් වංචාවේ වරදකරුවන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. වැටුප් වංචාව සඳහා විධිමත් විනය පරීක්ෂණ පවත්වා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | විනය පරීක්ෂණ පවත්වා අයකර ගැනීම සිදුකළ යුතුවේ. | අභියාචනා ඉදිරිපත් කර ඇත. වැටුප් වංචාව සඳහා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැත. | |
| (එ) | මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේදී වෙනත් ආයතනයකට ස්ථාන මාරුවී ගොස් තිබුණු සේවකයෙකුට ස්ථාන මාරුවී ගිය දින සිට 2018 ජූනි මස දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් සහ දීමනා ලෙස රු.1,816,557 ක් ගෙවීම් කර තිබීම නිසා අරමුදලට සිදුවී තිබුණු මූල්‍යමය අලාභය පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියකළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදුකර මුදල අයකර ගැනීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. | අයකරගෙන නැත. |
| **11.** | **පොළොන්නරුව මහා නගර සභාව** | | | |
| (අ) | කදුරුවෙල බස් නැවතුම්පලේ කඩ කාමර 18 ක හා පොළොන්නරුව රෝහල හන්දිය කඩ කාමර 19 ක හිඟ එක්වන් මුදල රු.2,120,821 ක් වර්ෂ 01 සිට වර්ෂ 21 දක්වා කාල පරාසයක සිට අයකර ගැනීමට කටයුතු කර | හිඟ මුදල් අයකර ගැනීමට හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කදුරුවෙල බස් නැවතුම්පොල කඩ කාමර හිමියන්ට එරෙහිව ඉදිරියේදී නීති ක්‍රියාමාර්ග ගැනීමටත් රෝහල් හන්දිය කඩකාමර සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදෙන නිර්දේශය මත ක්‍රියා කිරීමටත් පොදු | කඩ කාමර ගිහිපයක මුද්‍රා තැබීමෙන් පසු කුලී අයවෙමින් පවතින අතර, අය නොවන කඩ කාමර සඳහා සිහිකැඳවීම් යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණු අතර, පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 40 ක රු.18,088,750 ක ආපසු නොගෙවන අක් මුදල හා එහි කඩ කාමර 46 ක මාසික කුලී වටිනාකම රු.7,756,758 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අඩුපාඩු සම්පූර්ණ කළ පසු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමටත් අදහස් කර ඇත. | |
| **12.** රත්නපුර මහා නගර සභාව | | | | |
| (අ) | 2009 වර්ෂයේ සිට 2013 අගෝස්තු දක්වා කාලයට අදාල අයවිය යුතු එකතුව රු. 4,366,496 ක් වූ තානායම් කුලිය නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීමට හෝ ගෙවිය යුතු ණය මුදලට හිලව් කරගෙන තිබේද යන බව තහවුරු කර ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණු අතර, 2013 සැප්තැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා වූ කාලය සඳහා තවදුරටත් අයවිය යුතු රු. 156,121 ක් පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි. | අදාල ගැටළුව නිරාකරණය කර ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගත යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරියෙන් මීට අදාළ තොරතුරු තහවරු කර ගැනීමෙන් අනතුරුව විධිමත්ව තොරතුරුලබා දීමට කටයුතු කරන බව දන්වමි. ඒ අනුව තහවුරු ප්‍රකාශ ලබා දෙන ලෙස දන්වා ඇත. | නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2022 පෙබරවාරි 09 දින සාකච්ඡා කළ අතර, වාර්තාව සකසමින් පවතින බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සබරගමුව පළාතේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සභාව විසින් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 04 කදී එකතුව රු. 2,822,902 ක් වැයකර කළුගඟ අද්දර ඉදිකර තිබූ නාගරික උයන වල්බිහිවී විනාශ වී ඇති බැවින් ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ. | මෙම භූමිය ළමා උද්‍යානයක් වෙනුවෙන් සකස් කර තිබූ නමුත් වරින්වර ඇතිවූ ගංවතුර හේතුකොට ගෙන උද්‍යානය අවස්ථා කිහිපයකදී සෝදාපාළුවට ලක්වුණි. තවද මෙම උද්‍යානය ඵලදායි ස්ථානයක් බවට පත්කිරීමට විවිධ සැළසුම් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළද ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් වර්තමානයේ රත්නපුර නගරයට අත්‍යවශ්‍ය කරුණක් වන වාහන නතරකර තැබීමේ ස්ථානයක් බවට පත්කිරීමට සැළසුම් මේවන විට සකස්කර ඇත. | තවමත් ඵලදායී කටයුත්තකට යොදා ගෙන නොමැත. |
| (ඇ) | රත්නපුර නගරයේ පිහිටි ප්‍රධාන බස් නැවතුම්පලට බස්රථ පිවිසීමේ ගාස්තු වශයෙන් 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සබරගමුව බස් සමාගමෙන් අයවිය යුතු රු. 2,380,000 ක් 2020 වර්ෂය අවසන් | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මහ සභාවේ තීරණයට අනුව මසකට රු. 30,000 බැගින් අයකිරීමටත් හිඟ මුදල් ප්‍රවාහන අමාත්‍යාංශය හරහා ලබා ගැනීමටත් ගන්නා ලද තීරණයට අනුව මාසිකව මුදල් අයකර ගනු ලබන බව. | රු. 2,380,000 ක් වූ පැරණි හිඟය අයකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වනවිටත් අයකර ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | මහා නගර සභාවට අයත් කණාදොල කොම්පෝස්ට් අංගනයේ අකුණු සන්නායක සවිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා විසින් අන්තර්ජාලය ආශ්‍රයෙන් හඳුනාගත් ආයතන 05 නම්කර ලංසු කැඳවා තිබුණි. තාක්ෂණික කමිටු නිර්දේශ අනුව වැට් බදු සහිතව රු. 990,525 ක වටිනාකමකට ප්‍රසම්පාදන පිරිනමා තිබූ ආයතනය හැර සෙසු ආයතන අකුණු සන්නායක සැපයීම සිදු කරන ආයතන නොවන බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව ප්‍රසම්පාදනය පිරිනැමීමේ අරමුණින් මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් හා අකුණු සන්නායක සැපයීම් නොකරන වෙනත් ආයතන 04 කින් ලංසු කැඳවීම කර ටෙන්ඩරය පිරිනමා තිබුණි. | භාණ්ඩ මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුව සාධාරණ තරඟයකට ලක්කර සුදුසු ටෙන්ඩර්කරු තෝරා ගත යුතුය. | අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවීම සිදුකලද, එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කළ බවත්, මිලදී ගැනීම හේතුවෙන් සභාවට අලාභ සිදු නොවූ බව. | ලංකා විදුලි බල මණ්ඩලයෙන් මෙම අකුණු සන්නායකය පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. |

| 13. කොළඹ මහා නගර සභාව | | | | |
|---|---|---|---|---|
| (අ) | 2003 සිට 2016 වර්ෂය දක්වා හඳුනාගෙන තිබූ රු.214,628,001 ක හිඟ වරිපනම් ගෙවීමට තිබූ දේපළ 193 ක් එම දේපළවල හිමිකරුවන් පිළිබඳව හා අවසන් වරට හිමිකම් කියනු ලබන ඔප්පු හා පිඹුරු සොයා ගැනීමට නොහැකි වීම මත 2020 දෙසැම්බර් 31 දින වන විටත් මහා නගර සභා ආඥා පනතේ 259 වගන්තිය ප්‍රකාරව විකුණුම් සහතික ලිවීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය | වෙන්දේසි කළද මේ දක්වා ඔප්පුවක් මඟින් සභාවට පවරාගෙන නොමැති දේපළ වල හිඟ මුදල් ගෙවීම සඳහා දේපළ හිමිකරුවන් ඉල්ලීම් ඉදිරිපත් කරන බැවින් නාගරික කොමසාරිස්ගේ අනුමැතිය මත මෙම දේපළ වලින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත. | දේපල 60 ක ස්ථානීය පරීක්ෂා සිදුකර හිඟයෙන් රු.4,797,916 ක් අයකරගෙන ඇත. |
| (ආ) | නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරිමට 2015 වර්ෂයේදී රු.මිලියන 7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබූ ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවු.6 ක් ගත වී ඇතත් භාවිතයෙන් තොරව විහාරමහාදේවි උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. | කඩිනමින් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරිම. | යන්ත්‍රය මඟින් ලබාදෙන දත්ත විශ්ලේෂණය කල හැකි නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරිම සහ දත්ත විශ්ලේෂණය සඳහා යන්ත්‍රය මිලදී ගත් ආයතනය හා සාකච්ජා පැවැත්වීම. | දත්ත විශ්ලේෂණය කල හැකි ක්‍රියාමාර්ග ගැන පරික්ෂා කරමින් පවති. |
| (ඇ) | මල්වත්ත පාර පදික වෙළඳ සංකිර්ණය සඳහා එකක් රු.29,325 ක් බැගින් බක්කි | ඵලදායි කාර්යයන් සඳහා යොදාග ගැනීම. | බක්කි ලබා ගැනීම වෙළඳුන් විසින් ප්‍රතික්ෂේප කල බැවින් ඵලදායි කාර්යයට යොදා ගත | ඵලදායි කාර්යයකට යොදා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 200 ක් රු.5,865,000 කට 2016 සැප්තැම්බර් මස මිලදීගෙන තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම බක්කි කඩ ඵලදායි කාර්යයට යොදවා නොමැතිව ස්වාභාවික ආපදාවන්ට ගොදුරු වෙමින් අනාරක්ෂිතව නිශ්ප්‍රයෝජන තත්ත්වයට පත්වෙමින් පැවතුණි. | | නොහැකි වුවත් එම කඩ බක්කි වෙනත් පොදු වෙළඳපොළ අවශ්‍යතා මත යොදා ගැනීම සඳහා යෝජනා කර ඇත. | |
| (ඇ) | ස්ථාන මාරුවීම් ලැබූ හා විශ්‍රාම ගිය නිලධාරීන් හා සේවකයන් 23 දෙනෙකු 2020 දෙසැම්බර් 31 දින වන ටත් නිල නිවාස භුක්ති විඳින බැවින් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 ජුනි වන විට ස්ථාන මාරු ලැබූ නාගරික කොමසාරිස්වරුන් දෙදෙනෙකු ගෙන් අයකරගත යුතු දණ්ඩන කුලිය රු.27,100,751 ක් ලෙස ගණනය කර ඇතත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කිරීම | ජේ.එම්.බී. ජයවර්ධන මිය හා වී.කේ.ඒ.අනුර මයා හට අදාළ දණ්ඩන කුලිය ගණනය කර ඔවුන්ගේ සේවා ස්ථාන වෙත අය කර ගැනීම සඳහා යොමු කර ඇත | අයකර ගැනීම ආරම්භ කර නොමැත. |
| (ඉ) | ගොඩනැගිලි සැලසුම් අංක ME/PBC/BA/01/18 යටතේ අංක 32 මුදලිගේ මාවත කොළඹ 01 පරිශ්‍රයේ | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කඩිනමින් නීත්‍යානුකූල | අනුමත සැලසුම අනුව භාවිතයන් නිවැරදි කරන ලෙසත්, අනුමත සැලසුමට පටහැනිව සිදු කර ඇති | නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකර ඇති තට්ටු 7 යුත් වර්ග මීටර් 2143.75 ක්වූ ගොඩනැගිල්ල (B+G+6) හා පරිශ්‍රය පරීක්ෂා කිරීමේදී අනුමත සැලසුමේ පෙන්වා ඇති හිස් අවකාශය ආවරණය වන පරිදි මහල් 05 න් යුත් වර්ග මීටර් 533.46 න් යුත් අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. අනුමත සැලසුම් පරිදි බිම් මහල පොළව මට්ටමේ පැවතිය යුතු වුවත්, ගොඩනැගිල්ලේ බිම් මහල පොලව මට්ටමට වඩා මිලි මීටර් 380 ක් උඩින් ඉදිකර තිබුණි. අනුමත සැලැසුම පරිදි මුදලිගේ මාවතේ කෙලවරේ සිට අඩි 12 ක ඡන්න පථයක් (Arcade Line) සලකුණු කර ඇතත් එම ප්‍රමාණය ආවරණය වන පරිදි වර්ග මීටර් 40.61 ක අනවසර ඉදිකිරීමක් සිදුකර ඇත. අනුමත සැලැස්ම පරිදි වාහන 4 ක් ගාල් කිරීම සඳහා බේස්මන්ට් තුළ පහසුකම් සලසා දිය යුතු වුවත් වාහන ගාල් කිරීමේ කොටස ගබඩාවක් ලෙස භාවිතා කරමින් පැවතුණි. | ක්‍රියාමාර්ග ගැනීම. | ඉදිකිරීම් ඉවත් කරන ලෙසත් අයිතිකරුට දන්වා ඇත. | |
| (ඊ) | පාර්කින් මීටර් සවිකිරීම සම්බන්ධයෙන් පුද්ගලික ආයතනයකින් 2020 | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීම | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවති. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම කටයුතු කරමින් පවති. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු හිඟ කුලී ආදායම රු.101,161,649 ක් විය. | | | |
| **14.** මොරටුව මහා නගර සභාව | | | | |
| (අ) | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,200 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුලදී සභාව විසින් ගෙවන ලද රු.1,088,565 ක් සහ ඉතිරි මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණ පවත්වා නාගරික කොමසාරිස් වෙත පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇත. | විමර්ෂණ වාර්තාවේ ප්‍රතිඵල මත ඉදිරි කටයුතු කරමි. |
| (ආ) | අංක 1329 මුදල් දරන සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් රු.11,602,308 ක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ෂණයක් සඳහා කටයුතු කරමින් පවති. | විමර්ෂණ වාර්තාවේ ප්‍රතිඵල මත ඉදිරි කටයුතු කරමි. |
| 15. මීගමුව මහා නගර සභාව | | | | |
| (අ) | දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.157,101,803 ක මුදලකට වසරකින් නිම කිරීමට ගිවිසුම්ගතවී 2016 මාර්තු 16 දින වැඩ ආරම්භ කර තිබුණි.මේ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් අනුමත කර තිබූ රු. 168,000,000 ක ණය මුදලින් | කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර සභාවට සිදුවූ අලාභයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 සැප්තැම්බර් 30 දිනැති රු.4,700,000 ක් වටිනා චෙක්පත මඟින් අවලංගු කරන ලද ඇපකරයට අදාල මුදල සභාව වෙත ලැබී ඇති බව දන්වා ඇත. | මුල් කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධනය දුර්වල මට්ටමක පැවතීම මත ඉතිරි වැඩ සඳහා නැවත ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන තිබුණද ඇස්තමේන්තුව හා |

| | | | | |
|---|---|---|---|---|
| | වාරික ගෙවීම සඳහා ලබාදී තිබූ වසර 02 ක සහන කාලය අවසන්වූ 2019 දෙසැම්බර් 31 දින වන විට ලබා ගෙන තිබුණේ රු.88,155,805 ක මුදලක් පමණි. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම් අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමකින් තොරව විටින් විට කාලය දීර්ඝ කර තිබූ අතර ගිවිසුමට පටහැනිව කොන්ත්‍රාත් සමාගම හා උපදේශක ආයතනය සමඟ සාකච්ඡා කර උපකොන්ත්‍රාත් ලබා දීම සිදු කර තිබුණි. ඔවුන්ද ඉදිකිරීම අතරමග නවතා තිබුණ අතර ගිවිසුම්ගත බැඳීමක් නොමැති නිසා නීති මඟින් කටයුතු කිරීමට නොහැකිවී තිබුණි. 2020 මාර්තු 11 දින ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර තිබූ අතර 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සමාගමෙන් අයවිය යුතු රු.2,427,020 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 ජූනි වන විටත් මෙම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. | | | මිල විචලනයන් පවතින අයිතම සම්බන්ධයෙන් සාකච්ඡාවක් කැඳවූවද කොන්ත්‍රාත්කරු පැමිණ නැති අතර මේ සඳහා සභාවේ මන්ත්‍රී කණ්ඩායමක් විසින් නඩුවක් පවරා ඇති බැවින් මෙම ඉදි කිරීම අතරමග නැවතී ඇත. |
| (ආ) | මීපුර ඉඩමේ සම්පත් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.9,901,223 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2020 දෙසැම්බර් මස 21 දින ගිවිසුම්ගතවී තිබූ අතර කොන්ත්‍රාත්කරු එහි මූලික වැඩ ආරම්භ කර තිබුණි. මීපුර ඉඩමේ ඉදිකිරීමට නියමිත වූ මෙම ඉදිකිරීම නවතා කොච්චිකඩේ පැරණි සෝතකාගාරය පිහිටි ඉඩම මේ සඳහා තෝරාගෙන ඉහත කොන්ත්‍රාත්කරුටම ඉදිකිරීම් පවරා තිබූ අතර නව ඉඩමේ ඉදිකිරීම් සඳහා නැවත කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. 2021 අප්‍රේල් 01 දින පවත්වා තිබූ මහා සභාවේදී නව | ඉදි කිරීමට පෙර ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගත යුතුවේ. | නගරවාසීන්ගේ උද්ඝෝෂණ හේතුවෙන් ස්ථානය වෙනස් කිරීමට සිදුවී ඇත. | මෙම මුල් ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුව සභාවේ අනුමත කර ඇති අතර පෝරකේවත්ත ඉඩමේ මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සභා යෝජනාවක් ඇති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද මෙහි ඇස්තමේන්තුව සභාවේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබූ හෙයින් සහා අනුමැතියට පෙර ඉදිකිරීම් ආරම්භ කර තිබූ බව 2021 අප්‍රේල් 05 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එදින වන විට ගොඩනැගිල්ලේ පාදම හා කුළුණු ඉදිකර තිබූ බව දක්නට ලැබුණි. මීපුර ඉඩමේ මෙම ඉදිකිරීම කළ නොහැකි බව සඳහන් වනුයේ 2021 පෙබරවාරි 05 දින වූ අතර අදියර 3 කින් ලැබිය යුතු ප්‍රතිපාදනවලින් එක් අදියරයක ප්‍රතිපාදන වූ රු.3,679,900 ක් 2020 නොවැම්බර් 02 දින වන විටත් ලැබී තිබුණි. භූමිය වෙනස් කළ බව දැන්වීමක් නොකොට අත්තිවාරම් වැඩ සම්පූර්ණ කර හා කොන්ත්‍රාත්තුව කරගෙන යමින් පවතින බව සඳහන් කර දෙවන අදියරේ ප්‍රතිපාදනය වූ රු. 2,633,300 ක් 2021 මාර්තු 31 දින ලබාගෙන තිබුණි. | | | |
| (ඇ) | ඒත්තුකාල වෙරළ උද්‍යානයේ රථගාල ගාස්තු අයකිරීම සම්බන්ධ බදුකරය 2003 වසරේ සිට මුල් වසර 04 දක්වා ටෙන්ඩර් කැඳවා පිරිනමා ඇති අතර ඊලඟ වසර 10 සඳහා සියයට 5, සියයට 10 හා සියයට 20 යන ප්‍රතිශතයන්වලින් වැඩිකර නැවත 2017 වර්ෂයේ ටෙන්ඩර් කැඳවීමෙන්ද, 2018 වසර සඳහා 2017 මිලට සියයට 20 ක්ද 2019 වර්ෂයට 2018 වර්ෂයේ බදු මුදල සියයට 10 ක් වැඩිකර රු.2,244,000 කට ද ආරම්භයේ සිට මේ දක්වා එක් අයෙකුට ලබාදී තිබුණි. 2020 වසර සඳහා පසුගිය වසරේ බදු මුදලට පෙර බදුකරුටම ලබාදීමට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ. | සහා තීරණය පරිදි ලබාදී ඇති බව දන්වමි. | ටෙන්ඩර් කිරීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 ඔක්තෝබර් 05 දින සභාව තීරණය කර තිබු අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජුලි 24 දිනැති LGD/06/05/MOS/2019 අංක දරන ලිපිය පරිදි සභා දේපල බදුදීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කිරිමට පියවර ගන්නා ලෙසට උපදෙස් ලබාදී තිබුණද මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.සභා තීරණ ලැබීමට පෙර 2019 අගෝස්තු 29 දිනැතිව වෙනත් අයකු විසින් 2020 වර්ෂය සඳහා මෙම රථගාල රුපියල් ලක්ෂ 30 කට බදු ගැනීමට කැමති බවට ඉල්ලීමක් කර තිබූ බව නාගරික කොමසාරිස් විසින් 2019 සැප්තැම්බර් 20 දින වාර්තා කර තිබියදී එම මුදලට වඩා අඩු මුදලක් වූ රු.2,244,000 කට 2020 වර්ෂය සඳහා පෙර බදුකරුටම ලබාදී තිබුණි. ඒ හේතුකොට ගෙන රු.756,000 ක පාඩුවක් සභා අරමුදලට සිදු වී තිබුණි. | | | |
| 16. | **ගම්පහ මහා නගර සභාව** | | | |
| (අ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක - 2155/6 ගැසට් පත්‍රයේ 1 වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ නගරාධිපතිවරයාට උප නගරාධිපතිවරයාට හෝ වෙනත් කවර හෝ සභිකයෙකුට, නාගරික කොමසාරිස් හෝ වෙනත් කවර හෝ නිලධාරියෙකු වෙත පළාත් පාලන ආයතනයේ | මහා නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | නගරාධිපතිතුමන්ගේ සමාජ කාර්යයන් කෙරේ ඇති ප්‍රසාදය හා විශ්වාසය මත සභා අරමුදලට ලබා නොදෙන මුදල් ලබාගන්නා ක්‍රමයක් ලෙස නගරාධිපති අරමුදල හැඳින්විය හැකිය.<br>නගරාධිපති අරමුදලේ සියළුම වියදම් චෙක්පත් මඟින් පමණක්කර ඇති බව පෙන්වා දෙමි. | නගරාධිපති අරමුදල සෑම මහා නගර සභාවක් විසින්ම පවත්වාගෙන යනු ලබන අරමුදලකි.ඒ අනුව නගරාධිපති අරමුදල ගම්පහ මහා නගර සභාවේද පවත්වාගෙන යයි.නගරාධිපතිතුමන්ගේ සමාජ කාර්යයන් කෙරේ ඇති ප්‍රසාදය හා විශ්වාසය මත සභා අරමුදලට ලබා |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝජිතයෙකු, නිලධාරියෙකු වශයෙන් සලකා පිරිනමන කවර හෝ ත්‍යාගයක්, පරිත්‍යාගයක් එය මහා නගර සභාවට සිදුකරන ලද ප්‍රදානයක් වශයෙන් සලකා කටයුතු කළයුතු අතර එවැනි පරිත්‍යාග මහා නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාර මහා නගර සභා අරමුදලට බැර කළයුතුය. එහෙත් ගම්පහ රාජ්‍ය බැංකුවක් යටතේ නගරාධිපති අරමුදල නමින් බැංකු ගිණුමක්, නගරාධිපතිවරයාට ලැබෙන පරිත්‍යාග වලින් පවත්වාගෙන ගොස් තිබූ අතර 2020 වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් දක්වා වූ මාස 06 තුල අවස්ථා 09 කදී එකතු වටිනාකම රු.1,028,743 ක් ගිණුමට බැරවී තිබුණ අතර අවස්ථා 29 කදී එකතු වටිනාකම රු.1,016,425 ක ගෙවීම් පැවතුණි. මෙම ගණුදෙනුවලට අදාලව ලදුපත්, බිල්පත්, ගෙවීම් වවුචර් හෝ පිළිගතහැකි කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් නොකෙරුණි. | | මහා නගර සභා අඥාපනතේ අංක 185 යටතේ ලැබෙනසියළු ආදායම් ද, අංක 188 යටතේ කරන සියළු වියදම් ද, සභා අරමුදල යටතේම සිදු කර ඇති බව පෙන්වා දෙමි, නගරාධිපති අරමුදලේ සියළුම වියදම් චෙක්පත් මඟින් පමණක්කර ඇති බව පෙන්වා දෙමි.<br>මෙයට අදාල ලදුපත්, බිල්පත් ගෙවීම් වවුචර් යන ආදි ලියවිලි ලබාගැනීමට නගරාධිපති කාර්යාලය කොවිඩ් වසංගත තත්ත්වය මත වසා ඇති නිසා නොහැකි විය ඒ සඳහා කාලයක් ලබාදෙන මෙන් ඉල්ලමි. | නොදෙන මුදල් ලබාගන්නා ක්‍රමයක් ලෙස නගරාධිපති අරමුදල හැඳින්විය හැකිය. නගරයේ ප්‍රධාන පුරවැසියා ලෙස කටයුතු කිරීමේදී බල ප්‍රදේශයේ දිළිඳු අයට කරන පරිත්‍යාග,වැසිකිළි නොමැති අයට හා වැසිකිළි අබලන් අයට කරන පරිත්‍යාග, හදිසි ගංවතුර හා කොරෝනා උවදුර වැනි වසංගත අවස්ථාවන් හිදී වියළි ආහාර හා ආහාර පාර්සල් බෙදා දීම වැනි ඉතා හදිසි කටයුතු සඳහා මෙම අරමුදල භාවිතයට ගනු ලබයි . |
| (ආ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිනමා ශාලා 5 කින් රු.5,067,942 ක් වටිනා හිඟ විනෝද බදු ආදායමක් අයකර ගැනීමට පැවති අතර එයින් රු.4,793,162 ක් වූ හිඟ වටිනාකමක් පබ්ලික් | හිඟ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සිනමා ශාලා විවෘත වූ සැනින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. පබ්ලික් සිනමා ශාලාවේ නඩු තීන්දුව ප්‍රකාරව ආයතනය කටයුතු නොකිරීම නිසා නඩු කටයුත්ත යාවත්කාලීන | 2010 වර්ෂයේ සිට පබ්ලික් සිනමා ශාලාවේ බදු නොගෙවීම නිසා මෙම හිඟ බදු ශේෂය දක්නට ලැබේ.ඒ සඳහා එම බදු පැහැර හැරීමට එරෙහිව නඩු පවරා ඇති |

| | | | | |
|---|---|---|---|---|
| | සිනමා ශාලාවෙන් අයකර ගැනීමට පැවතුණි. | | කිරීම සඳහා නාගරික නීති නිලධාරි වෙත ගොනුව යොමු කර ඇත. | අතරම, තවදුරටත් 2021 දක්වා යාවත්කාලීන කර ඇති හිඟ ශේෂ සඳහා ද නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නාගරික නීති නිලධාරි වෙත යොමු කර ඇත. |
| (ඇ) | 2020 වර්ෂයේ පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කිරීම වෙනුවෙන් ඉඩම් හිමිකරුවෙකුට රු.29,127,000 ක් ගෙවා තිබුණු අතර, 2020 සැප්තැම්බර් 07 දින කසළ බැහැරකරන ස්ථානය පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂාවට අනුව, පරිසරයට නිරාවරණය වීම හා සෞඛ්‍යයට හානිවන අයුරින් කසළ කඳු ගොඩගසා තිබූ බව නිරීක්ෂණය වූ අතර, කසළ බැහැර කරන කසළ දමන ස්ථානයේ සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳව සුපරික්ෂාකාරී වන ලෙසත් හා ඒ පිළිබඳව වාර්තා කරන ලෙසත් ගම්පහ මහාධිකරණය විසින් සභාවේ සෞඛ්‍ය පරීක්ෂක වරයාට ලබාදී තිබුන නියෝගය අනුව සභාව කටයුතු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | කසළ බැහැර කිරීමේ කාර්යය සඳහා විධිමත්ව ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර කසළ බැරකරුවන් තෝරා ගතයුතු අතර විධිමත්ව ගෙවීම් හා කසළ බැහැර කිරීම් කටයුතු කළයුතු වේ. තවද අධිකරණය ලබාදුන් නියෝග ක්‍රියාවට නැංවීමද, කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගම්පහ මහා නගර සභාවේ කසළ කෙරවලපිටිය කසළ අංගනයට බැහැර කිරීම සිදුකළ අතර ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/03/02/4/27 හා 2019/08/02 දිනැති ලිපියේ උපදෙස් වලට අනුව සභා තීරණයක් ගෙන පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කිරීම සිදු කරන ලදී. මෙම ස්ථානයේ කොම්පෝස්ට් නිෂ්පාදිත යන්ත්‍රයක් සවිකර ඇත.එය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදුනි.අදාල බලපත්‍ර ලබා නොතිබූ බැවින් ඒ සඳහා මාස 03 ක් ඇතුළත බලපත්‍රය ලබාගන්නා ලෙසත් එහි පිටපතක් අප වෙත ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී. | මෙම කාලසීමාවේදී කෙරවලපිටිය කසළ අංගනයේ නඩතත්තු කටයුතු සිදුකර ඇති බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/3/2/4/27 හා 2019.08.02 දිනැති ලිපියේ උපදෙස්වලට අනුව සහා තීරණයක් ගෙන පෞද්ගලික ඉඩමකට කසල බැහැර කිරීම සිදුකරනු ලැබේ. පෞද්ගලික හිමිකරු විසින් ඉන්වොයිසියකකට හා සමාන ලියවිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර විධිමත් ඉන්වොයිසියක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඒ අනුව කටයුතු කර ඇත. |
| 17. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව | | | | |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 185(2)(ඉ) හි විධිවිධානවලට පටහැනිව මිශ්‍ර ආදායම්, වරිපනම් හා සැලසුම් අංශවල මහජන | මහා නගර සභා ආඥා පනතේ 185(2)(ඉ) අනුව කටයුතු කළයුතු වේ. | සභාවට ආදායම් ඉපයීමට මෙම කාර්ය මණ්ඩලය අතිරේක වෙහෙසක් දරයි. එබැවින් දිරි දීමනාවක් | විධිමත් පරිදි අනුමැතියක් ලබාගෙන නැත. 2020 හා 2021 දී |

| | | | | |
|---|---|---|---|---|
| | සේවා සැපයීමෙන් 2019 ජනවාරි සිට ජුනි දක්වා උපයන ලද ආදායමෙන් රු.1,181,197 ක් විධිමත් අනුමැතියකින් තොරව නිලධාරින් 27 දෙනෙකු අතර බෙදාගෙන තිබුණි. | | වශයෙන් 2005 වර්ෂයේ දී 2004.11.29/08(09) 15 සහා සම්මුතිය ප්‍රකාරව අය කරනු ලබන රු.200/- ක මුදල ලිපිගොණුවෙහි කාර්යන්ට සහභාගි වන සමස්ත කාර්ය මණ්ඩලය අතර බෙදා දෙනු ලබයි. | පිළිවෙළින් රු.1,457,923 ක් හා 771,197 ක් බෙදාගෙන තිබුණි. |
| (ආ) | වනරතන පාරේ සිට ෆොන්සේකා පාර දක්වා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2018 පෙබරවාරි මස රු.4,500,000 ක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද 2019 වර්ෂය අවසන් වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබු අතර පවුල් 02 කට පමණක් සෘජු ප්‍රවේශයක් ලැබෙන මෙම මාර්ගය ඉදිකිරීම සඳහා දරන වියදම හා සාපේක්ෂව බැලීමේදි ලැබෙන ප්‍රතිලාභය අවම මට්ටමක පැවතුණි. | වඩාත් ඵලදායී කාර්යයන් සඳහා මුදල් යෙදවිය යුතුවේ. | සහා අනුමැතිය ඇතිව මෙම මාර්ග සංවර්ධන කටයුතු කර ඇත. | 2021 අවසන් වන විටත් ඉඩම් අත්පත් කරගැනීම සඳහා කිසිදු කටයුත්තක් කර නැත. |
| (ඇ) | ප්‍රේෂර් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම හා දෙහිවල මහජන ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා පිළිවෙළින් රු.50,000,000 ක් හා රු.60,000,000 ක් වශයෙන් එකතුව රු.110,000,000 ක වියදමක් 2018 මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කර්මාන්ත දෙකෙහි ඉදිකිරීම් නිම කර නොතිබුණි. | ව්‍යාපෘති කඩිනමින් ඉටු කළ යුතුවේ. | ඉතා ඉක්මනින් වැඩ අවසන් කර ජනතාව වෙත ලබාදීමට කටයුතු කරමි. | මෙහි මූල්‍ය ප්‍රගතිය 22% ක් හා භෞතික ප්‍රගතිය 12% ක් වේ. |
| (ඈ) | රූඩ් 01 පර්චස් 4.19 ක් විශාල වූ ගල්කිස්ස වත්ත නැමති ඉඩම බාහිර | අනවසරයෙන් භුක්ති විදින පාර්ශවයන්ගෙන් | මේ පිළිබඳව ඉදිරියේ දී කමිටුවට ඉදිරිපත් කර සොයා බලා කටයුතු කර | මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පාර්ශවයක් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණි. | ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | විගණනයට අදාල තොරතුරු ඉදිරිපත් කරමි. | |
| (ඉ) | ගල්කිස්ස හෝටල් පාරේ අංක 4/89 දරන බිම් සැලැස්මේ රූඩ් 01 පර්චස් 4.10 ක් වූ ඉඩම වාහන නැවතුම් පොලක් ලෙස භාවිතා කිරීම සඳහා ගල්කිස්ස හෝටලය වෙත බදු දී තිබුණු අතර මෙම දේපල බදුදීමේදී ගිවිසුම්වල පවත්නා අඩුපාඩු හේතුකොට ගෙන 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම දේපලේ හිඟකුලිය රු.4,636,516 ක් වී තිබුණ අතර එම කුලි මුදල් බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ කුළිය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී. තව ද මෙම හෝටලය සහ නගර සභාව අතර තිබූ බදු කාලය 2021.06.01 දිනෙන් අවසන් වූ අතර නැවත බදු දීමක් සිදුනොවේ. එම ඉඩම සභාව විසින් වෙනත් සංවර්ධන කටයුත්තක් කිරීමට නියමිතය. | හිඟ කුළිය අයකර නොමැත. |
| **18.** කඩුවෙල මහා නගර සභාව | | | | |
| (අ) | 2013 වර්ෂයේ කඩුවෙල බස් නැවතුම් පොළෙහි සවිකරන ලද රු.3,900,000 ක් වටිනා විදුලි සෝපානය වර්ෂ ගණනාවක සිටම අක්‍රීය තත්ත්වයේ පවතින අතර එය අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | වෙනත් නියෝජිත ආයතනයකින් හෝ කිහිපයකින් පරීක්ෂා කරන ලෙස ඉල්ලීම් කරමින් නැවත ක්‍රියාත්මක කල හැකි තත්ත්වයකට සකස් කිරීමට කටයුතු කරමි. | 2016 වර්ෂයේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් කඩුවෙල නගරයම ගං වතුරට යටවීම හේතුවෙන් විදුලි සෝපානය අක්‍රීය විය. මේ අවස්ථාවේ විදුලි සෝපානය අළුත්වැඩියා කිරීම සඳහා ඉහත මිලදීගත් ආයතනය සමඟ සම්බන්ධවී සිදු කිරිමට උත්සහ කලද එම ආයතනය වසා දැමීම හේතුවෙන් එම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කාර්යය ඉටුකර ගැනීමට නොහැකි විය. |
| (ආ) | නගර සභා බලප්‍රදේශයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා 2017 ඔක්තෝබර් 20 වන දින රු.66,612,046 ක වියදමක් දරා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර එකක 6 න් රු.53,351,000 ක් වටිනා යන්ත්‍ර 04 ක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතුරුගිරිය උපකාර්යාල පරිශ්‍රයේ නිශ්ක්‍රීයව රදවා තිබුණි. | සභා දේපළ පිරියත හා උපකරණවලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවේ | වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැත. | කාපට් ඇතිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීමේ අරමුණින් අදාල යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන ඇති නමුත්, රජයේ අනුමත වැටුප් පරිමාණයන්ට සේවයෙහි යෙදවීමට පුහුණු ශ්‍රමිකයන් සපයා ගැනීමේ අපහසුතාවය මත එම ඒකකය ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත2020. 03. 03 දින පැවති මහා සභාවේදී එම යන්ත්‍ර විකිණීම සඳහා තීරණය කර ඒ අනුව ටෙන්ඩර් කැඳවීමක් සිදුකළද කිසිදු අයදුම්කරුවකු ඉදිරිපත් නොවුණි. |
| **19.** ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව | | | | |
| (අ) | රු.619,276,616 ක කොන්ත්‍රාත් වටිනාකමට පිටකෝට්ටේ ජය රජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ 2016 පෙබරවාරි 15 දින | සභාවට වැය වී ඇති මුළු වටිනාකම අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළයුතු වේ. | එම කොන්ත්‍රාත්කරු මගින්ම නැවත ව්‍යාපෘතිය අවසන් කිරීමේ ශක්‍යතාවය අධ්‍යනය කරමින් පවතී. | එම කොන්ත්‍රාත්කරු මගින්ම නැවත ව්‍යාපෘතිය අවසන් කිරීමේ ශක්‍යතාවය අධ්‍යනය කරමින් පවතී. මේ දක්වා දරන ලද මුළු වියදම |

| | | | | |
|---|---|---|---|---|
| | ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා උපදේශක ගාස්තු ලෙස රු.2,638,191 ක් ඇතුළත්ව මුළු වියදම රු.255,707,477 ක් 2018 වර්ෂය දක්වා වැයකර තිබූ අතර ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ඉරි තැලීමේ දෝෂයක් මත සභාව විසින් 2017 මැයි 17 දින ව්‍යාපෘතියේ වැඩ නතර කර ඇති අතර 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත්කරු වැඩබිම අත්හැර දමා තිබුණි. | | | රු.255,707,477 ක් වන බිම් මට්ටම පමණක් සිදු කර ඇත. |
| (ආ) | ඇස්තමේන්තු වටිනාකම රු.69,704,581 ක් වූ නිවාස ඒකක 28 කින් සමන්විත මොරගස්මුල්ල සිවි මහල් නිවාස සංකීර්ණය මාස 6 ක කාල සීමාවකදී වැඩ අවසන් කර භාරදීම සඳහා 2016 ජුනි 01 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.62,986,117 ක් හා අමතර වැඩ සඳහා රු.7,538,424 ක් ඇතුළුව රු.70,524,541 ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු වැඩ අවසන් නොකර කර්මාන්තය අත්හැර දමා තිබුණි. තවද 2019 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැහැරව සභාවේ ඍජු ශ්‍රමය | සභාවේ මෙහෙයුම් කටයුතු නිසි ක්‍රමවේදයක් අනුව සිදුවිය යුතු වේ. | නැවත එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. | වැඩ අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යොදා ගනිමින් නිවාස ඒකක 18 ක් සඳහා රු.3,630,781 ක අමුද්‍රව්‍ය පිරිවැයක් හා රු.155,726 ක ආහාර , ජලය, විදුලිය සඳහා වැයකර තිබුණද වැඩ අවසන් නොකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | | | |
| (ඇ) | වැලිකඩ පොලීසිය අසල පිහිටි සභාවට අයත් ඉඩමක නව නගර සහා කාර්යාල ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීමට අදාල ගෘහ නිර්මාණ කටයුතු සඳහා රු.36,010,657 ක ගාස්තුවක් යටතේ උපදේශක සමාගමක් සමග 2015 ජනවාරි 26 දින ගිවිසුම් ගත වී රු.22,220,340 ක් ගෙවා තිබුණි. 2015 මැයි 07 දිනැති සභා තිරණයක් මත ඉහත ඉදිකිරීම දැනට පවතින සභා පරිශ්‍රයෙහි ඉදිකිරීම සඳහා උපදේශක සමාගම සමග ගිවිසුම්ගත වී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.4,000,000 ක් ගෙවා තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. සභාවෙන් අයවිය යුතු රු.15,138,788 ක් අයකර ගැනීම සඳහා උපදේශක සමාගම විසින් සභාවට එරෙහිව බේරුම්කරණ නඩුවක් පවරා තිබුණු අතර ඒ | මහා පරිමාණ කර්මාන්තයක් ඉදිකිරීමට ප්‍රථම ස්ථානය නිශ්චිත කරගත යුතු අතර ඒ සඳහා දැරීමට සිදුවන වියදම් ඇස්තමේන්තු සකස් කළයුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතු වේ. | වැලිකඩ පොලීසිය අසල ඉඩමේ නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ බේරුම්කරණ නඩු තීන්දුව ක්‍රියාත්මක කිරීමට උපදේශන සමාගම එලබ ඇත. නමුත් බේරුම්කරණ තීරණය අනුව ගෙවීම් කටයුතු සිදුකර නොමැත. | බේරුම්කරණ නඩු තීන්දුව නිතිගත කිරීමට සිදුකර ගැනීම සඳහා උපදේශන සමාගමට අධිකරණයෙන් නඩු පවරා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනුවෙන් නඩු ගාස්තු ලෙස රු.259,000 ක් වැයකර තිබුණි. එම නිසා මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැයකර තිබුණු රු.26,479,340 ක මුදල ආර්ථික හා ඵලදායී බවින් තොර වියදමක් බවට පත්ව තිබුණි. | | | |
| (ඈ) | සභාවට අයත්ව තිබූ රු.7,000,000 ක් වටිනා කැබ් රථය, 2017 අගෝස්තු 15 දින බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්වරයාගේ නිල රථය ලෙස පරිහරණය කිරීමට භාර දී තිබියදී ගිනිගෙන විනාශ වී තිබුණි. රථය වර්තමාන වෙළඳපල වටිනාකම හා සභාවට වැය වූ අතිරේක වියදම් රු.7,046,180 ක් වූ අතර ලැබුණ රක්ෂණ වන්දි මුදලට අනුව සභාවට සිදු වූ පාඩුව රු.1,546,180 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. | අලාභය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. | ඉතිරි මුදල් අයකර ගැනීම වෙනුවෙන් සිදු කළ පරීක්ෂණ වාර්තාවට විරෝධතාවයක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් නැවත පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කර ඇත. | රු.1,546,180 ක් අයකර ගැනීම වෙනුවෙන් සිදු කළ පරීක්ෂණ වාර්තාවට විරෝධතාවයක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් නැවත පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කර ඇත. |
| **20.** කුරුණෑගල මහා නගර සභාව | | | | |
| (අ) | කුරුණෑගල බස් නැවතුම්පොලෙහි හිස් අවකාශ වල ඇස්තමේන්තු වටිනාකම රු.14,232,000ක් වූ කඩ 18ක් ඉදිකර ගැනීම සඳහා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි අදාළ දැන්වීම් ප්‍රසිද්ධ කර | කාලාන්තරයක් තිස්සේ පෞද්ගලික ආයෝජකයින් විසින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ගරු නගරාධිපති තුමා විසින් | අවිධිමත්ව අනුමැතිය ලබාගෙන කඩ බදුදීම් සිදුකිරීම වර්තමානයේත් සිදුකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නගරාධිපතිවරයා විසින් සෘජුවම ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලබාගෙන කඩ කාමර ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ඉල්ලුම්කරුවන්ට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලබාදීමට කටයුතු කර තිබුණි. | තරඟකාරී මිල ගණන් මත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ඊට අදාල නාම ලේඛනය මහා සභා අනුමැතිය මත බදුදීම සිදුකර ඇත. | |
| (ආ) | ඉලුප්පුගෙදර පාර ජලනල එළිමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 02 යටතේ පී.වී.සී. නළ මතට ගංගා වැලි යෙදීමට රු.612,779ක් ගෙවා තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී ගංගා වැලි යොදා නොතිබුණු ස්ථාන හා ගංගා වැලි අඟලක පමණ ඝනකමට යොදා තිබුණු ස්ථාන පැවතුණි. ඒ අනුව නොකළ වැඩ සඳහා රු.510,649ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉටුනොකල වැඩ සඳහා කළ ගෙවීම් ආපසු අයකළ යුතුවේ. | ගංගා වැලි දැමීමේදී ප්‍රමාණිකව සෑම ස්ථානයක් සඳහාම සමානව ප්‍රායෝගිකව යෙදිය නොහැකි අතර ක්ෂේත්‍ර ස්වභාවය අනුව යෙදීමේදී අඩු වැඩි වීම් සිදුවේ. අවශ්‍ය පරිදි ගංගා වැලි පී.වී.සී නළ මත යොදා ඇත. | මේ පිළිබඳව පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර රැඳවුම් මුදල් ගෙවා නොතිබුණි. |
| (ඇ) | ඉලුප්පුගෙදර මාර්ගයේ ජල නළ එලීමේ පළමු කොන්ත්‍රාත්තුව නිම කිරීමෙන් පසු මාර්ගයේ ගිලා බැසීම් හේතුවෙන් කාපට් කිරීම සඳහා ජල නළ එලන ලද කාණු හාරා පස් | මහජන මුදල් ආර්ථිකව, කාර්යක්ෂමව ඵලදායී ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම මාර්ගයේ මූලික අදියර කාපට් කිරීමට නියමිත වූ පළල ප්‍රමාණයට අතිරේකව උරහිස් (shoulders) මතින් පී.වී.සී. නළ එලන ලදි. ඉන්පසුව | විගණන නිරීක්ෂණයන්ට අනුව පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉවත් කර වැසීමට රු.4,000,000ක නව ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. මෙම මාර්ගය කාපට් කරන බව සභාව දැනුවත්ව තිබියදී ජල නළ එලීම සඳහා එකම වැඩ විෂයයන් වෙනුවෙන් ඇස්තමේන්තු 02ක් සකස් කර ගෙවීම් සිදුකර තිබීමෙන් පළමු ඇස්තමේන්තුවේ වැය විෂයයන් 03ක් වෙනුවෙන් දරන ලද රු.1,208,305ක වියදම සභාවේ නොසැලකිල්ල මත දැරීමට සිදු වූ වියදමක් විය. | | මාර්ගයේ පළල කාණුව අසලටම ( Drain edge to edge) කාපට් කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි. එහිදී ජල නළ එලා තිබූ උරහිස් (shoulders) නැවත ක්‍රමවත් ලෙස සනවත් කිරීම සිදු කිරීමට අවශ්‍ය බැවින් තිබූ පස් ඉවත් කර සණවත් කිරීම සිදු කර ඇත. | |
| (ඇ) | නගරාධිපතිවරයාගේ පෞද්ගලික වාහනය වෙනුවෙන් 2019 වර්ෂයේ පෙබරවාරි සිට ජූලි දක්වා සහ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා නිල රථ දීමනාව ලෙස මසකට රු.250,000 බැගින් රු2,000,000 මුදලක්ද 2020 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස දක්වා මසකට රු.250,000ක් බැගින් රු.500,000ක් ද විධිමත් අනුමැතියකින් | ගරු නගරාධිපතිවරයාට අනුමත නිලරථ දීමනාවක් ගෙවීමටද අනුමැතියකින් තොරව ගෙවා ඇති මුදල් අයකර ගැනීමටද කටයුතු කළ යුතුවේ. | ගරු ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ මැතිතුමා විසින් ගරු නගරාධිපතිතුමාගේ නිලරථ දීමනාව ලෙස මාසිකව රු50,000ක් ගෙවීම සඳහා NWP/GOV/AO/07/34/01 හා 2020/10/02 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.<br>ඒ අනුව මේ වන විට සභා අරමුදලින් ගෙවන ලද රු.250,000 ගෙවීම | මේ වන විට රු.750,000ක මුදලක් අයකරගෙන ඇත. යම් හෙයකින් වැඩිපුර ගෙවන ලද මුදල ගෙවා අවසන් කිරීමට පෙර ගරු නගරාධිපති තුමාගේ ධූර කාලය අවසන් වුව හොත් එදිනට ශේෂය ගෙවීම සඳහා ලිඛිතව එකඟතාවය පළකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | තොරව ගෙවා තිබුණි. තවද එම වාහනය වෙනුවෙන් 2019 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා රු.726,596ක් වටිනා ඉන්ධන ලීටර් 5,474ක් ද 2020 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා රු.148,500ක් වටිනා ඉන්ධන ලීටර් 1,125ක් ද සභාවෙන් සපයා තිබුණි. | | අත්හිටුවා රු.50,000 නිලරථ දීමනාවක් ගෙවන අතර වැඩිපුර ගෙවන ලද මුදල එම මුදලින් හිලව් කර ගැනීමට කටයුතු කර ඇත. | |
| (ඉ) | මහා නගර සභා ආඥා පනතේ 185 (1) වගන්තිය සෑම මහා නගර සභාවකටම මහා නගර සභා අරමුදලක් පිහිටුවිය යුතු බවට උපදෙස් ලබා දී ඇතත්, නගරාධිපති අරමුදලක් පිළිබඳව පනතේ විධිවිධාන සලසා නොතිබියදී වාර්ෂික අයවැයෙන් රු.2,279,800ක මුදලක් ප්‍රතිපාදන සලසාගෙන රු. 2,008,852ක මුදලක් වැයකර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 215 යටතේ අයවැය ලේඛනයේ වෙනස්කිරීම් දක්වා ඇතත්, පනතේ නගරාධිපති අරමුදලක් පිළිබඳව සඳහන් නොමැති බැවින් විවිධ අරමුදල් පිහිටුවීම නොකළ යුතුවේ. | මහා නගර සභා අරමුදල මගින් වාර්ෂික අයවැය යටතේ 11472 වැය ශීර්ෂයට මුදල් වෙන් කරනු ලබන අතර බලප්‍රදේශයේ සුභ සාධන කටයුතු සඳහා එම වැය ශීර්ෂය යටතේ සභාවේ අනුමැතිය ඇතිව ආධාර සපයනු ලබයි. | 2022 වර්ෂයේ සිට 11472 වැය ශීර්ෂය ප්‍රජා සහනාධාර ලෙස නම් කර ඇත. |
| (ඊ) | 2020 වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.64,549,182ක් විය. එයින් රු.75,000ට වැඩි හිඟයක් පවතින ජල | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ | රු.75,000ට වැඩි හිඟ පවතින ජල පාරිභෝගිකයින් දස දෙනෙක් අර්ධයකට වඩා ගෙවා ඇත. | වර්තමානයේදී ද ජල ගාස්තු විධිමත්ව නොගෙවන බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| | පාරිභෝගිකයින් 52 කට අදාලව රු.28,076,433 ක හිඟයක් විය. මෙම හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | යුතු අතර වර්ෂයේ බිල් කිරීම කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පාරිභෝගිකයින් තිදෙනෙකු ජල සැපයුම විසන්ධියට යොමු කර ඇත. පාරිභෝගිකයන් 21කගේ ජල සම්බන්ධතා විසන්ධි කර නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි පාරිභෝගිකයන්ගේ හිඟ මුදල් අයකර ගනිමින් පවතී. | |
| (උ) | මහා නගර සභාවේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා නව මෘදුකාංග යටතේ රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා රු2,046,000ක ටැබ්ලට් පරිගණක 60ක් මිලදී ගෙන තිබුණු අතර අවශ්‍ය මෘදුකාංග upload කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගෙන නොතිබුණි. ක්ෂේත්‍රයේ ජල මනු කියවීම, වරිපනම් බිල් නිකුත් කිරීම, අනතුරු දායක ගස් කැපීම, අනවසර වෙළඳාම් ඉවත් කිරීම, ජල නඩත්තු කටයුතු සිදුකරන කාර්ය මණ්ඩලයට ටැබ් පරිගණක ලබා දීමේ අවශ්‍යතාවය විගණනයට තහවුරු නොවීය. | අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. | ජල මනු කියවීම, වරිපනම් බිල්පත් ලබාදීම, අනවසර වෙළඳාම් ඉවත් කිරීම ජල නඩත්තු කටයුතු සිදු කරන කාර්ය මණ්ඩලයට නව මෘදුකාංගය යටතේ සේවය කිරීමේදී ජනතාව වෙත කාර්යක්ෂමව හා ඵලදායීව සේවාව ඉටු කිරීමේ පහසු බව මෙන්ම ඒ හරහා ඉහල නිලධාරින් සෘජුවම සම්බන්ධ වීම. අවශ්‍ය උපදෙස් හා ගැටලුකාරි තත්වයන් මගහරවා ගැනීමට රාජකාරි ජාලය අඛණ්ඩව ක්‍රියාත්මක වීමට මෙම මෘදුකාංගය ක්‍රියාත්මක කරවීමේ අවශ්‍යතාව බව සඳහන් කරමි. | අත්‍යාවශ්‍ය රාජකාරින් සඳහා මෙම ටැබ් යන්ත්‍රය ලබාදිය යුතු වුවත් අවශ්‍යතාවයකින් තොරව ලබාදී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු හා නගර සභාවට ආදායමක් ලබාගත හැකි පොදු දේපලක් ලෙස පැවති බුවනෙක හෝටලය පිහිටි ගොඩනැගිල්ල විධිමත් අනුමැතියකින් තොරව කඩාදැමීම සඳහා කුරුණෑගල මහා නගර සභාවේ ඉහළ කළමනාකාරිත්වය කටයුතු කර තිබුණි. මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ නිර්දේශයන් ලබාගෙන නොතිබුණු අතර 2020 ජූලි මස 14 දින අදාළ ගොඩනැගිල්ල කඩා දැමීමට කටයුතු කර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් ලෙස නම් කර වරෙන්තු නිකුත් කළ නිලධාරින් වෙනුවෙන් රු 7,800,000ක් නඩු ගාස්තු ලෙස නගර සභා අරමුදලින් ගෙවා තිබුණි. | පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ගොඩනැගිලි කඩා දැමීමේදී අදාළ ආයතනවල අනුමැතිය හා මහා සභා අනුමැතිය ලබා ගත යුතු වේ. | මහා නගර සභාව සතු දේපල වන පැරණි උපදිසාපති කාර්යාල ගොඩනැගිල්ලට අදාලව මහා නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සිය තීරණ සහ කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේදී මහා නගර සභාව සද්භාවයෙන් කටයුතු කර ඇත.මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන වලට අනුව නෛතික භාවයෙන් යුතුව අදාළ නඩු ගාස්තු ගෙවා ඇති බවද සඳහන් කරමි. | මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය, ගරු අභියාචනාධිකරණය හා ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී. |
| (එ) | මහා නගර සභා පනතේ 36 (1) III වගන්තිය ප්‍රකාරව යම් දේපලක් විකිණීම හෝ අන් ලෙසකින් අන්සතු | මහා නගර සභා ආඥා පනතේ 361 ( ii ) වගන්තියට අනුව | මහා සභාව විසින් GC/06/53/2020/12/10 දරණ සභා සම්මුතිය මඟින් සම්මත කර ඇති බැවින් | නීති, රීති අනුව ඉඩම් බැහැර කිරීම විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයාගේ ලිඛිත එකඟත්වය කලින් නොලබා ඒ දේපල විකිණීමට හෝ අන්සතු කිරීමට සභාවට බලය නොමැති වුවද, වැහැර වත්ත මහා නගර සභාව සතු ඉඩම් නීත්‍යානුකූලව පවරා දීමට මහා සභා සම්මතයක් ලබාගෙන බැහැර කර තිබුණි. | විධිමත්ව ඉඩම් බැහැර කිරීමටද මහා නගර සභාව සතු ඉඩම් ආරක්ෂා කිරීමටද ඉඩම් බදු දීමේදී ටෙන්ඩර් ක්‍රම අනුගමනය කිරීමටද කටයුතු කල යුතු වේ. | දැනට පදිංචිව සිටින පදිංචිකරුවන් සඳහා එම ඉඩම විධිමත් පරිදි නියමානුකූල කර දීමට කටයුතු කරමින් පවතී. මහා නගර සභා ආඥා පනතේ 40 I ඊ II වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් තොරව බැහැර කිරීමට අනුමැතිය පවතින හෙයින්ද මහා සභා අනුමැතිය මත මෙම ඉඩම නියමානුකූල කර නීත්‍යානුකූලව භුක්තිය ලබා දීමට කටයුතු කරමින් පවතී. | වර්තමානයේදී ද මේ ආකාරයටම අවිධිමත් ලෙස ඉඩම් බැහැර කරන බව. |
| (ඒ) | රජයේ ඉඩම් ආඥා පනතේ 27 වන වගන්තිය හා මහා නගර සභා අඥා පනතේ 36 (1) වගන්තියට අනුකූල නොවී මහා සභා අනුමැතිය හා නගරාධිපතිවරයා විසින් සෘජුව ආණ්ඩුකාරවරයා ඇමතූ ලිපියකට ආණ්ඩුකාරවරයා අත්සන් තැබීම යන අවිධිමත් ක්‍රියාපටිපාටියක් මත ඉඩම් 03ක් බදු දීමට කටයුතු කර තිබුණි. රජයේ ඉඩම් | මහා නගර සභා ඉඩම් බදු දීමේදී මහා නගර සභා ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. රජයේ තක්සේරුව ලබාගෙන විධිමත් බදු | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපති තුමාගේ ලිඛිත එකඟත්වය ලබා ගන්නා තෙක් සභා සම්මුතීන් මත ඉඩම් තුන බදුදී ඇති අතර පැවරුම් නියෝග ලැබුන පසු අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය වෙත යැවීමට නියමිතය. | නීති,රීති අනුව කටයුතු නොකර රජයේ ඉඩම් හා නගර සභා ඉඩම් බැහැර කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පවරාදීම සම්බන්ධ වන මග පෙන්වීම් උපදෙස් මැයින් වූ අංක එස්.ඊ.අයි/ඒ/4/34 හා 1995/7/12 දිනැති ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ ඡේද අංක 7 ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් පවත්නා වෙළඳපල තක්සේරුව මත නිගමනය කරන ලද යථාරූපි බදු කුලියක් නියමකර බදු අයකළ යුතු වුවත්, ආදායම් පරීක්ෂක තක්සේරුවක් මත පදනම්ව උක්ත බදුදීම් සිදුකර තිබුණි. | ගිවිසුමකට එළඹිය යුතුවේ. | | |
| (ඔ) | මහා නගර සභාව යටතේ පාලනය වන පෙර පාසැල් සඳහා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට රු 4,481,000ක් ගෙවීම් කර තිබුණි. මෙම මිලදී ගැනීම සඳහා තාක්ෂණික කමිටු වාර්තාවක් ලිපිගොනුවේ නොතිබුණු අතර, ඒ අනුව තාක්ෂණික ඇගයීමකින් තොරව මෙම උපකරණ ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. මෙම ආයතනය පිළිබඳ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූලව සභා අරමුදල් වැය කිරීමට කටයුතු කළයුතුවේ. | අදාළ උපකරණ පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියෙහි නිර්දේශ මත එම උපකරණ මිළදී ගෙනඇති බව සඳහන් කරමි.<br>නැවත භාණ්ඩ සැපයීම් සිදුකරන විට අදාළ භාණ්ඩ සැපයීම සඳහා ලියාපදිංචි අයිතිය ඇති සැපයුම් කරුවන්ගෙන් මිළදී ගැනීම සඳහා තිබෙන හැකියාව පිළිබඳව සොයා | මිලදී ගැනීම් ක්‍රියාවලියේ අඩුපාඩු නිවැරදිකර ගැනීමක් සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පරීක්ෂාවේ දී මිලදී ගැනීම සිදුකර ඇත්තේ පෙර පාසල් උපකරණ අලෙවි කරන ආයතනයකින් නොවන බැවින් මෙම මිලදී ගැනීම තුළ අක්‍රමිකතාවයක් සිදු කර රජයට වාසි සහගත වන ලෙස විධිමත් ප්‍රසම්පාදනයක් සිදු කර නොතිබුණි. | | බලන ලෙස නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. | |
| (ඕ) | මධ්‍යම වෙළඳපල ඉදිකිරීම සඳහා රුපියල් 687,068,527 ක ඇස්තමේන්තුවක් සකස් කර රු.948,518,334 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටු පත්කිරීම, ලංසු නිවේදනය සකස් කිරීම ඇතුළු ලංසු ලේඛණ පිළියෙල කිරීම, ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීම, | ඇස්තමේන්තුව BSR (අනුමත ගොඩනැගිලි) අනුව සකස් කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ටෙන්ඩර් ප්‍රදානය කර ඉංජිනේරු හා තාක්ෂණික නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් ප්‍රමිතියට කල යුතු වේ. | නිසි පරිදි මහ සභා තීරණයට අනුකූලව වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තු විශේෂඥ මණ්ඩලයක් මගින් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගෙන මුල් ඇස්තමේන්තුවේ සඳහන් අඩුපාඩු වූ මූලික අයිතිමයන් (Preliminaries) හා මධ්‍යම වායු සිසිලන පද්ධතිය (Central A/C System) නැවත සකස් කර ඇස්තමේන්තු සංශෝධනයක් සිදුකර GC-06(04)-2020.02.13 දරණ මහා සභා සම්මුතිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට | වර්තමානයේදී ද මහා පරිමාණයේ ඉදිකිරීම් සිදු කරන අතර, නගර සභාව තුල මෙම ඉදිකිරීම් අනුමත කිරීම සඳහා අදාල ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙකු නොමැත. ප්‍රසම්පාදන කමිටුව නගර සභා ඉංජිනේරු හා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවකින් තීරණය ගනු ලබයි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කරගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලංසු නිවේදන ප්‍රසිද්ධ කිරීම, ලංසු ඇපකර ලබාගැනීම, ලංසු ඇගයීම ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුරාම අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය. මෙම ප්‍රසම්පාදන කටයුතු ඇරඹී දින සිට ලංසුව ප්‍රදානය කිරීම දක්වා කාලය තුළ අදාල කටයුතුවලට සම්බන්ධ වී ඇති පාර්ශවයන් හා ආයතන ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවූ රු.281,934,447ක මුදලකට හෙවත් සියයට 41ක් ඉක්මවූ මිලක් ඉදිරිපත් කරන ලද ලංසු කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | | අනුකූලව ටෙන්ඩර් පිරිනමා ඇත. | |
| (ක) | ගරු නගරාධිපති නිල නිවස සඳහා සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමය තෝරාගෙන තිබුණද, මහා නගර සභාවේ සිවිල් ඉංජිනේරුවරයෙකු හා අනෙකුත් සියළු සම්පත් පැවතියදී හා අනෙකුත් තාක්ෂණික සහාය ලබාගැනීමට හැකියාව තිබියදී මහා නගර සභාවට | මහා නගර සභාවේ ඉදිකිරීම් සිදුකිරීමේදී මහා නගර සභාවට අයත් වාසිදායක වන ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | ගරු නගරාධිපතිතුමා නගරයේ පළමු පුරවැසියා වන අතර ගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැති තුමා ඇතුළු VIP පුද්ගලයන් මෙම නිල නිවසට පැමිණෙන අතර ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා පැමිණෙන අවස්ථා වලදී මෙම නිල නිවසේ නවාතැන් ගැනීම සිදුවන | මහජන සේවයට කැපවී ඇති මහජන නියෝජිතයන් අවම වියදමින් සැපයීම්, සේවා හා ඉදිකිරීම් සිදුකල යුතු වුවත්, එවැන්නක් නිරීක්ෂණය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | වඩාත් වාසිදායක වන ආකාරයට අවම පිරිවැයකින් නිල නිවස ඉදිකිරීමට තිබූ අවස්ථාව මෙමගින් අහිමි වී ගොස් තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6.2.2 ප්‍රකාරව දැන්වීමක් පළ කළද අදාළ කාල සීමාව ලබා නොදීම හා දෙවන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම් සංශෝධනයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිරිපත්වීම පාලනයක් සිදුවී තිබුණි. මෙම ව්‍යාපෘතිය බිම් මහල හා පළමු මහලයකින් පමණක් සමන්විත බැවින් විදුලි සෝපානයක් (Lift) සවිකිරීමට අවශ්‍යතාවයක් නොමැති වුවද රු 4,129,600 වැයකර විදුලි සෝපානයක් සවිකිරීමට කටයුතු කර තිබුණි. | උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. ඉදිකිරීම් සිදු කිරීමේදී ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය , ප්‍රමිතියට අනුව වැඩ නිම කිරීම පරීක්ෂා කළ යුතු වේ. | බැවින් මේ සඳහා විදුලි සෝපානයක් සවි කිරීමට කටයුතු කර ඇත. තවද, නගරාධිපති තුමා හමුවීමට මහජනතාව පැමිණෙන අවස්ථාව ආබාධිත පුද්ගලයින් පැමිණීමේදී ඔවුන් හට ඍජුව නගරාධිපතිතුමා හමුවීමට අවස්ථාව ලබා දීම පිණිසද මෙම විදුලි සෝපානය සවි කිරීමට කටයුතු කර ඇත. | |
| (ග) | මාළිගාපිටිය ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 165,207,414ක් වූ කොන්ත්‍රාත්තුව සඳහා මිල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රසම්පාදන ක්‍රම තෝරා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා මහා නගර සභා ආඥා පනතට අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | අදාළ නීති රීති තුල ප්‍රසම්පාදන හා ඉදි කිරීම් කටයුතු සිදු නොකරන බව නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කැඳවීම් අනුව රු.185,456,135 ක් හා රු.300,655,750ක් ලෙස මිල ගණන් දෙකක් ලැබී තිබුණි. එම මිල ගණන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.9.2 අනුව රු. මිලියන 500 නොඉක්මවන කොන්ත්‍රාත්වල විස්තරාත්මක ලංසු ඇගයීම් මූලධර්ම සහ ක්‍රමවේද අනුගමනය නොකර හා අවම ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 18% කින් වැඩි වී තිබියදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ගැනීම ලංසු ඇගයීම මිල විචලතා සලකා බලා කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතුවේ. | | |
| **21. කල්මුණේ මහා නගර සභාව** | | | | |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය ප්‍රකාරව මහනගර සභා බලප්‍රදේශයට අයත් කොට්ඨාශවල ඇති නිශ්චල දේපළ 47,900ක් සහ ඉඩම්වලින් වර්ෂයකටත් වැඩි අයකළ යුතු දේපළ බදු රු. මිලියන 91.6ත් 2020 වර්ෂය අවසාන වන විටත් අයකර නොතිබුණි. | නියමිත කාලයේදි හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ අයනොකර පවතින ආදායම් අයකිරීමට කටයුතු කර ඇත. | හිඟ මුදල් අයකර නොතිබුණි. |
| (ආ) | 1987 වර්ෂයේ සිට හිඟහිටිව පවතින පොදු වෙළෙඳපොල බදු කුලි රු.12,314,393ක්, මස්කඩ බදුකුලි රු.7,661,912ක් සහ | ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි වැඩි අවධානයක් යොමු කෙරේ. | ආදායම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කඩකාමර කුලි රු.13,657,443ක් අයකිරීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැතුණි. | | | |
| (ඈ) | 1996 වර්ෂයේ සිට හිඟහිටිව පවතින ත්‍රිරෝද රථ සහ වාහන ආරක්ෂක බදු රු.3,394,613ක් අයකිරීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැතුණි. | ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදී වැඩි අවධානයක් යොමු කෙරේ. | ආදායම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2020 වර්ෂයේ රජයේ බස් නැවතුම්පොළ හිඟ කඩකුලි රු.4,219,400ක්, කල්මුණේ වෙළෙඳපොල කඩකාමර හිඟකුලි රු.3,907,615ක් එක්සත් චතුරශ්‍රයේ ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර හිඟ කුලි රු. 1,735,750ක්, කෙසෙල් කඩ හිඟකුලි රු.613,995ක් සහ පුද්ගලික බස් නැවතුම්පළ කඩකාමර හිඟකුලි රු.450,000ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | හිමිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟ කුලි අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මහනගර සභා බලප්‍රදේශයට අයත් පොදු වෙළෙඳ පොල පිහිටි ස්ථානයට ආසන්නයේ ඇති පුද්ගලික කඩකාමර මාසිකව අවම වශයෙන් | කුලි ආදායම් ඉහළ නැංවීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | සභාවට අයත් කඩකාමර 435 කට අදාල වර්තමාන මිල ගණන් කැඳවීමක් සිදු නොකර 1980 |

| | | | | |
|---|---|---|---|---|
| | රු.10,000 සිට රු.20,000 දක්වා පරාසයක කුලියට දෙනු ලබන නමුත්, මහනගර සභාවට අයත් මෙම කඩකාමර නව මිල ගණන් කැඳවීම් සිදු නොකර 1980 වර්ෂයේ සිට මාසික කුලිය රු.500 සිට රු.4,000ක් දක්වා පරාසයක කුලියකට ලබාදී තිබුණි. මේ නිසා සභාවට වාර්ෂිකව ආසන්න වශයෙන් රු. මිලියන 60ක් අහිමි වෙමින් පවතී. | | | වර්ෂයේ පැවති කඩ කාමර කුලිය මත 2022 වර්ෂයේදීද කඩ කාමර බදු දී තිබුණි. |
| (ඊ) | කල්මුණේ සහ සායින්තමරුදු ප්‍රදේශවල ළමා වෙරළ උද්‍යාන ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.26,780,072ක් සහ රු.8,267,830ක් වැය කර තිබුණි. නමුත් ඒවා සභාව විසින් භාවිතා නොකර නිෂ්කාර්යව පවතින අතර එහි සවිකර තිබූ උපකරණ අනාරක්ෂිත තත්ත්වයේ පැවතුනි. | ළමා උද්‍යාන නඩත්තු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල උද්‍යානයට වර්තමානයේ මුරකරුවෙකු පත්කර නඩත්තු කරමින් පවතී. | ළමා උද්‍යානය නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **22. අක්කරෙයිපත්තු මහා නගර සභාව** | | | | |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට පොදු වෙළෙඳපොල කඩකාමර හිඟ කුලි රු.7,699,381ක් අයකර ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුවේ. | හිඟහිටි මුදල් අයකිරීමට පියවර ගත යුතුවේ. | කුලි ආදායම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2014 වර්ෂයේ ගිනි නිවීමේ ඒකකයක් ආරම්භ කිරීම වෙනුවෙන් රු.19,882,270ක වියදමින් ඉදිකළ ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් අවසන් නොකළ තත්ත්වයෙන් වර්ෂ 07ක කාලයක් අතහැර දමා තිබුණි. | අදාල ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙය සම්පූර්ණ කිරීමට අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇත. | 2022 ජනවාරි වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 40 හා 30 ක පහල අගයක පැවතුණි. |
| (ඇ) | නෙල්සිප් වැඩසටහනෙන් ස්ථාපිත කළ ළමා උද්‍යානයේ ළමා විදුලි දුම්රිය 2018 වර්ෂයේ සිට අක්‍රීය වීමෙන් රු.මිලියන 2.3ක අරමුදල් නිෂ්කාර්යව පැවැතුණි. | ළමා විදුලි දුම්රිය කඩිනමින් ක්‍රියා කරවීමට කටයුතු කළ යුතු වේ. | ළමා විදුලි දුම්රිය ක්‍රියා කරවීමට පියවර ගෙන ඇත. | ළමා විදුලි අළුත්වැඩියා කිරීමට සභාව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 ජනවාරි වන විටත් ළමා විදුලි දුම්රිය ධාවනයට යොදාගෙන නොතිබුණි. |
| (ඈ) | ඝණ අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා රු.999,500ක් වැයකර 2018 වර්ෂයේදී මිලදීගෙන සවිකර තිබූ යන්ත්‍රය 2020 මැයි 15 දින වන විටත් මුළුමනින්ම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නැවතත් එම මෙහෙයුම් ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ජනතාව විරෝධය දැක්වීම හේතුවෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කඩිනම් කිරීමට නොහැකි විය. | වත්කම් ඵලදායිව උපයෝජනය කර නොතිබුණි |
| 23. **යාපනය මහා නගර සභාව** | | | | |
| (අ) | සභාව භාවිතා කළ වාහනයක් 2014 ජුනි මාසයේදී අනතුරට ලක් වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 1 වැනි පරිශිෂ්ටය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර සභා අරමුදලින් රු. 1,958,200 ක් වැයකර අලුත්වැඩියාව සිදුකර තිබුණි. | මෙම හානිය නොපමාව නිරවුල් කළ යුතු වේ. | කොමසාරිස්වරයාගේ ඉල්ලීම පරිදි නැවත විමර්ශනයක් සිදු කරමින් පවතී. | මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 වර්ෂයේ දී සභාවේ කළමනාකරණ සහකරුවෙකු විසින් වංචනිකව ලබාගත් මුදලින් රු. 2,614,429 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වංචා කළ මුදල අයකර ගත යුතුය. | සභාව විසින් දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පවරා ඇත. එසේම පොලිසිය විසින්ද නඩු පවරා දැනට නඩු දෙකම විභාග වෙමින් පවතී. | මුදල් අයකර ගෙන නොමැත. |
| **24.** මඩකලපුව මහා නගර සභාව | | | | |
| (අ) | ජීව වායු නිෂ්පාදනය සඳහා රු.මිලියන 2 ක් වැය කර තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කරගෙන නොතිබුණි. | ඉදිරියේදී ආදායම් ඉපයීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. | තාක්ෂණික පහසුකම් දුර්වල නිසා බෙදාහැරීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතී. | අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නැත. |
| (ආ) | මහා නගර සභා බල ප්‍රදේශයට අයත් පුද්ගලික ඉඩමක් කට්ටි කර විකිණීමේදී ඉන් කොටසක් මහා නගර සභාවට පොදු පහසුකම් සඳහා පැවරිය යුතුය. මෙලෙස මහා නගර සභාවට පැවරූ පර්චස් 97 ක පමණ රුපියල් මිලියන ගණනක් වටිනා ඉඩම් 5 ක් හිටපු ආණ්ඩුකාරවරයා විසින් ඔහුගේ බිරිඳගේ නමටත් ඔහුගේ නමටත් 2003-2006 කාලපරිච්ඡේදයේදී පවරාගෙන තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. | අල්ලස් කොමිෂන් සභාවේ විමර්ශනයක් කරගෙන යනු ඇත. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඇ) | නැගෙනහිර පළාත් සභාවෙන් ලබාදුන් උපමාන පාදක ප්‍රදාන (CBG) රු.මිලියන 10.4 ක අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂ 4 කට අධික කාලයක් අඛණ්ඩව බැංකු ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි. | වත්කම් උපයෝජනය කිරීමට හෝ ආදායම් ඉපයීමට කටයුතු කළයුතුය. | ලිපිලේඛන ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කර නොමැත. |